




# අරුණ

2023 ජූලි 17 සඳුදා | හතර වැනි කාණ්ඩය | 245 කලාපය | මිල රු 60.00 | www.aruna.lk



**පුවත්පත**
නිවසටම ගෙන්වා ගැනීමට
දැන්ම අමතන්න : 0761 367 623
නැතිනම් මෙම කේතය ස්කෑන් කර තොරතුරු ලබා දෙන්න


## මණ්ඩලෙන් මාලිගාවට කෝටියක විදුලි ඇස්තමේන්තුවක්

# විදුලි බිල ගෙවා හෝ දළදා පෙරහර කරනවා

## දියවඩන නිළමේ කියයි

■ සාලිය කුමාර ගුණසේකර/ කමල් සුරවීර-මහනුවර

විදුලි බිල මහනුවර ඇසළ පෙරහරට බාධාවක් කර නොගන්නා බවද විදුලි බිල ගෙවා හෝ පෙරහර උත්කර්ෂවත් පරිදි කරන බව ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිළමේ ප්‍රදීප් නිලංග දෑල පැවසීය. මෙවර මහනුවර ඇසළ පෙරහරේ විදුලි ආලෝකකරණය සඳහා ලංකා විදුලි බල මණ්ඩලය මගින් ඇස්තමේන්තු ගතකර ඇති මුදල රුපියල් එක්කෝටි තිස් දෙලක්ෂ අනූනව දහස් දහයකි.

▸▸ 02 පිටුවට

## වසීම් අක්‍රම්ගේ කඩේ කඩා කෝටියක ඇට උස්සලා

### මරදන්කඩවල පොලිසිය බඩු හොයයි

■ දීපා වසන්ති එදිරිසිංහ

වසීම් අක්‍රම් නමැත්තකුට අයත් මරදන්කඩවල පිහිටි කෘෂිබීජ අලෙවි සල බිඳ රුපියල් කෝටියක අධික වටිනාකමින් යුත් කෘෂිබීජ ටින් තොගයක් සොරාගෙන ගොස් ඇතැයි මරදන්කඩවල පොලිසියට පැමිණිල්ලක් ලැබී ඇත.

▸▸ 02 පිටුවට

## 50%ක තෙල් සංචිත නැති ෂෙඩ් සංස්ථාවේ පාලනයට

■ අශිකා ජයවීර

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් සියලුම ඉන්ධන පිරවුම්හල්වලට සියයට පනහක ඉන්ධන සංචිතයක් පවත්වාගෙන යාම අනිවාර්ය කර තිබියදී එයට අනුගත නොවෙමින් කටයුතු කරන සියලුම පිරවුම්හල් ඛනිජ තෙල් සංස්ථාව පාලනයට ගන්නා බව එම සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂ අද්මිරාල් රවීන්ද්‍ර විජේගුණරත්න පැවසුවේය.

▸▸ 02 පිටුවට

## අරගලයේ සිටි ජවිපෙ කට්ටියගෙ ගිණුම් බලන්න ඕන

-ජොන්ස්ටන්

■ සුනිල් රූපසිංහ - පල්ලේපොළ



අරගලයට සහභාගී වූ ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු සියලුදෙනාගේම ගිණුම්වලට මුදල් බැර වූ ආකාරය පිළිබඳ සොයා බැලිය යුතු බව පාර්ලිමේන්තු මන්ත්‍රී ජොන්ස්ටන් ප්‍රනාන්දු පැවසීය. එමෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ මහ මොළකරුවන් කියා ගන්නා පිරිසගේ ජානවල ඇත්තේ වෛරය, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය සහ ඝාතන සංස්කෘතිය පමණක් බවද මන්ත්‍රීවරයා සඳහන් කළේය.

▸▸ 02 පිටුවට

## කොටලීයේ පෙරළුණේ දුනු කැඩුණු බසයක්

### ගිය මාසේ යෝග්‍යතා සහතිකයත් අරගෙන



■ එෆ්. අස්ලම්

මගීන් 11 දෙනෙකුට දිවි අහිමිකරමින් 42 දෙනෙකුට තුවාල කරමින් මනම්පිටිය කොටලීය පාලමෙන් පෙරළී ගිය බස් රථයේ දුනු කොළය තැන් තුනකින් බිඳීගොස් පැස්සුම් කර තිබෙන බවට මෝටර් රථ පරීක්ෂකවරුන් සිවුදෙනෙකු විසින් කරන ලද පරීක්ෂණයේදී අනාවරණය වී තිබේ.

▸▸ 02 පිටුවට

## කෙහෙළියට විතරක් නොව විශ්වාසභංගය ගේන්නේ ආණ්ඩුවටම

-මුජිබර්

■ අනීෂා මානගේ



විශ්වාසභංගය ගෙන එන්නේ සෞඛ්‍ය ඇමැතිවරයාට පමණක් නොව රාජපක්ෂ - වික්‍රමසිංහ ආණ්ඩුවට එරෙහිව බවත් මේ සම්බන්ධයෙන් අද දින සිට සාකච්ඡා ආරම්භ කිරීමට විපක්ෂ නායකවරයා බලාපොරොත්තු වන බවත් සමගි ජනබලවේගයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමාන් පැවසීය.

▸▸ 02 පිටුවට

## සාජන් ගෙදර යන ගමන් කාන්තාවකට මාංචු දා ලේ පනින්න ගහලා

■ තිස්ස රවීන්ද්‍ර පෙරේරා

කාන්තාවකට අත්විලංගු දමා ලේ වැගිරෙන්න පහර දෙමින් වත්තල ප්‍රධාන මාර්ගය දිගේ ඇදගෙන ගිය පොලිස් සැරයන්වරයකු වත්තල පොලිසිය විසින් ඊයේ (16 වැනිද) රාත්‍රියේ අත්අඩංගුවට ගෙන ඇත.

▸▸ 02 පිටුවට




## මම බයවෙලා දුවන කෙනෙක් නොවේ -කෙහෙළිය



■ ජානක එස්. බණ්ඩාර - කුණ්ඩසාලේ
■ කමල් සුරවීර-මහනුවර

මේ දිනවල වැඩියෙන්ම අභියෝගයට මුහුණ දී ඇති තමා ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයට එරෙහිව ඇතැම් පිරිස් යටිකුට්ටු වැඩ ගොඩක් සිදුකරන බව සෞඛ්‍ය ඇමැති කෙහෙළිය රඹුක්වැල්ල පැවසීය.

▸▸ 02 පිටුවට

## අධිනීතිඥයාගේ නියෝගයට පිටුපා අඩ නින්දේ සිටි රාලහාමි ගෙදර

■ තිස්ස රවීන්ද්‍ර පෙරේරා

▸▸ 02 පිටුවට

## ඒඩ්ස්වලින් බේරෙන්න පිනට දෙන එන්නතක්

■ අනීෂා මානගේ

▸▸ 02 පිටුවට






චන්ද්‍රයාන් - 3 දියත් කිරීම නැරැඹීමට පැමිණ සිටි පිරිසෙන් කොටසක්



# ඉන්දියාවේ 'චන්ද්‍රයාන්' සඳේ දක්ෂිණ ධ්‍රැවයට ගොඩබසිනවා

## සඳ වෙත ළඟා වෙන්නේ තව දින 38කින්

## කිලෝ 3,900ක් බරයි

## ඉන්දීය රු.බිලියන 6.1ක ආයෝජනයක්

එතෙර අරුණ

■ රුක්ෂාන් බණ්ඩාර

සඳ ගැන ලියැවී ඇති සාහිත්‍යමය පබැඳුම් අති මහත්ය. එහෙත් එසේ නොවන සඳ සම්බන්ධයෙන් විද්‍යාව හා බැඳුණු ප්‍රකාශයක් පසුගිය සියවසේ ලොව වඩාත් ප්‍රචලිත විය.

ඒ, "එය මිනිසාට එක් කුඩා පියවරකි. එහෙත් එය මිනිස් වර්ගයා තැබූ එක් යෝධ පිම්මක්" යන්නය. එසේ පැවැසුවේ අන් කිසිවකු නොව සඳ මත පා තැබූ පළමු පුද්ගලයා වූ නීල් ආම්ස්ට්‍රෝන්ය. ආම්ස්ට්‍රෝන් ඇතුළු පිරිස රැගත් "ඇපලෝ 11" යානය 1969 ජූලි 16 පළමු සඳ ගමන අරඹා වසර 54ක් සම්පූර්ණ වීමට දින කිහිපයක් තිබියදී (ජූලි 14 වැනිදා) ඉන්දියාවද එම මාවතේ ගමන් කරමින් සිය තෙවන සඳ ගමන ආරම්භ කළේය. ඉන්දියාව මෙම චන්ද්‍ර මෙහෙයුම නම්කර ඇත්තේ "චන්ද්‍රයාන් - 3" යනුවෙනි. එම මෙහෙයුමේ ප්‍රමුඛ අරමුණ වන්නේ චන්ද්‍රයාගේ මෙතෙක් ගවේෂණය නොකළ දක්ෂිණ ධ්‍රැවය ආසන්නයට ගොඩබෑසීමය.

ඒ අනුව චන්ද්‍රයාන් - 3 අභ්‍යවකාශ යානය ඉන්දියාවේ, දකුණු අන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්තයේ ශ්‍රී හරිකොත පිහිටි "සතිෂ් ධවාන්" අභ්‍යවකාශ මධ්‍යස්ථානයෙන් පසුගිය සිකුරාද (14 වැනිදා) පස්වරුවේ "ලෑන්ඩරය සහ රෝවරයක්" සහිතව අභ්‍යවකාශගත විය. යානයේ ලෑන්ඩරය අගෝස්තු 23 - 24 දිනවල සඳ වෙත ළඟාවීමට නියමිතය. මෙම ගමන සාර්ථක වුවහොත් ඇමරිකාව, පැරණි සෝවියට් සංගමය සහ චීනයට පසුව සඳ මත මෘදු ගොඩබෑමක් සිදු කළ සිව්වන රට බවට ඉන්දියාව පත්වනු ඇත. යානය රැගත් රොකට්ටුව ශ්‍රී හරිකොත වෙතින් අභ්‍යවකාශගත වූයේ විද්‍යාඥයන්ගේ සහ ලක්ෂ සංඛ්‍යාත ජනයාගේ ප්‍රීතිඝෝෂා මධ්‍යයේය. එම ස්ථානයේ සිටි බීබීසී පුවත් සේවයේ අරුණෝදයි මුඛර්ජි පවසා ඇත්තේ ශාලාවේ සෑම අස්සක් මුල්ලක් නෑරම "භාරත් මාතා කි ජායි (ඉන්දියා මාතාවට ජයග්‍රහණය)" යනුවෙන් පවසමින් මෙහෙයුමට එක්වූ කණ්ඩායම ජයඝෝෂා පැවැත්වූ බවය.

ඉන්දියාවේ මෙම ඓතිහාසික පියවර සම්බන්ධයෙන් ට්විටර් පණිවුඩයක් නිකුත් කරමින් අගමැති නරේන්ද්‍ර මෝදි පවසා ඇත්තේ 'චන්ද්‍රයාන්-3 ඉන්දියාවේ අභ්‍යවකාශ මෙහෙවරේ නව පරිච්ඡේදයක් රචනා කර ඇති' බවය. 'එය සෑම ඉන්දියානුවකුගේම සිහින හා අභිලාසයන් ඉහළ නංවමින් ඉහළට නැඟේ. මෙම සුවිශේෂී ජයග්‍රහණය අපගේ විද්‍යාඥයන්ගේ නොපසුබස්නා කැපවීම පිළිබඳ සාක්ෂියකි. ඔවුන්ගේ ආත්මයට සහ දක්ෂතාවයට මම ආචාර කරමි' යැයි මෝදි එහි වැඩිදුරටත් සටහන් කර ඇත. ඉන්දියාවේ චන්ද්‍ර ගවේෂණ වැඩ සටහනේ තුන්වැන්න වන චන්ද්‍රයාන්-3 එහි පෙර මෙහෙයුම්වල සාර්ථකත්වය මත ඉදිරියට ගමන් කරවීමට අපේක්ෂා කෙරේ. චන්ද්‍රයාන් - 3 පිටත්ව යන්නේ 2008දී පළමු ඉන්දීය සඳ මෙහෙයුමෙන් වසර 13කට පසුවය. චන්ද්‍රයාන් - 1 හි ව්‍යාපෘති අධ්‍යක්ෂ මයිල්ස්වාමි අන්නාදුරෙයි පෙන්වාදෙන ආකාරයට සඳ මතුපිට ජලය ගවේෂණය සහ සඳෙහි වායුගෝලයක් ඇති බව තහවුරු කරගැනීම පළමු මෙහෙයුමේ ඉලක්ක විය.

දෙවැනි මෙහෙයුම වූ චන්ද්‍රයාන් - 2 ලෑන්ඩරයකින් සහ රෝවරයකින්ද සමන්විත විය. එය 2019 ජූලි මාසයේදී දියත් කෙරිණි. නමුත් සාර්ථක වූයේ අර්ධ වශයෙනි. එහි කොටසක් අදටත් සඳ වටා රවුම් ගසමින් අධ්‍යයන සිදුකරමින් සිටින නමුත් ලෑන්ඩර -රෝවරය මෘදු ගොඩබෑමක් සිදු කිරීමට අපොහොසත් විය. ස්පර්ශ කිරීමේදී එය කඩා වැටිණි. ඒ, තිරිංග පද්ධතියේ අවසාන මොහොතේ ඇති වූ දෝෂයක් නිසාය. කිලෝග්‍රෑම් 3,900ක් බරැති සහ ඉන්දියානු රුපියල් බිලියන 6.1ක (ඩොලර් මිලියන 75ක) පිරිවැයක් වන චන්ද්‍රයාන් - 3 මෙහෙයුම 'සඳ මතුපිට මෘදු ගොඩබෑමක් සහතික කිරීම' අරමුණු කර ඇත.

චන්ද්‍රයාන් - 3 උඩු ගුවනේ

චන්ද්‍රයාන් - 3 යානයේ ලෑන්ඩරය (සඳ මතුපිට ගොඩබෑම සඳහා භාවිත කරන කුඩා යානය) ඉන්දීය අභ්‍යවකාශ පරේයෂණ ආයතනයේ ආරම්භකයකු වන 'වික්‍රම්' නමින් නම්කර ඇත. එහි බර කිලෝග්‍රෑම් 1,500ක් පමණ වේ. ප්‍රඥාව සඳහා සංස්කෘත වචනය වන 'ප්‍රග්‍යාන්' ලෙස නම් කර ඇති කිලෝග්‍රෑම් 26ක රෝවරය (සඳ මතුපිට ගමන් කරන කුඩා රොබෝව) භෞතික ගවේෂණ කටයුතු සිදුකිරීමට නියමිතය. සිකුරාද අභ්‍යවකාශගත වීමෙන් පසු යානය සඳෙහි කක්ෂයට ඇතුළු වීමට දින 15ත් 20ත් අතර කාලයක් ගතවනු ඇත. විද්‍යාඥයන් ඊළඟ සති කිහිපය තුළ රොකට්ටුවේ වේගය අඩුකිරීමට පටන්ගෙන එය 'වික්‍රම්ට' මෘදු ගොඩබෑමකට ඉඩ සලසන ස්ථානයකට ගෙන එනු ඇත. සියල්ල සැලසුම් කළ පරිදි සිදුවුවහොත් රෝද හයේ 'ප්‍රග්‍යාන්' රෝවරය චන්ද්‍රයාගේ මතුපිට පාෂාණ සහ ආවාට වටා සැරිසරමින්, විශ්ලේෂණය සඳහා නැවත පෘථිවියට යැවීමට තීරණාත්මක දත්ත සහ ඡායාරූප රැස් කරනු ඇත.

සඳෙහි දක්ෂිණ ධ්‍රැවය තවමත් ඇත්තේ ගවේෂණය කර නොමැති තත්ත්වයකය. එහි සෙවණැල්ලේ පවතින මතුපිට ප්‍රදේශය චන්ද්‍රයාගේ උත්තර ධ්‍රැවයට වඩා විශාල වන අතර එයින් අදහස් කරන්නේ ස්ථිරව සෙවණැල්ලක් ඇති ප්‍රදේශවල ජලය පැවැතීමේ හැකියාවක් පවතින බවයි. චන්ද්‍රයාන් - 1 යනු 2008දී දක්ෂිණ ධ්‍රැවයට ආසන්නව සඳ මත ජලය සොයාගත් පළමු යානයයි. දෙවැනි මෙහෙයුම අර්ධ ලෙස සාර්ථක වූ බැවින්, එහි පැවැති සියලු දෝෂ නිරාකරණය කරගනිමින් ක්‍රියාත්මක මෙම තෙවැනි මෙහෙයුමේදී වඩාත් සාර්ථක ගොඩබෑමක් සහ ගවේෂණයක් සිදුකිරීම අරමුණු කර තිබේ. ලෑන්ඩරයේ සහ රෝවරයේ බැටරිවලට හිරු එළිය අවශ්‍ය වන බැවින් චන්ද්‍ර දිනයක් (සඳ මත දවසක් පෘථිවියේ දින 14කට සමාන) වැයකර බැටරි ආරෝපණය කරගැනීමටද අපේක්ෂා කෙරේ. ඉන්දියාවේ මෙම ගවේෂණයේ අවසාන අරමුණ ව්‍යාපෘති ප්‍රධානී අන්නදුරෙයි මෙසේ පැහැදිලි කර ඇත.

'මෙම ගවේෂණයේ අවසාන ඉලක්කය වන්නේ චන්ද්‍රයා එනම් කිලෝමීටර 360,000ක් ඈත අභ්‍යවකාශයේ පෘථිවි මහාද්වීපයක් බවට පත්වන දිනක අපි නිෂ්ක්‍රීය නරඹන්නෙකු නොව, එම මහාද්වීපයේ ක්‍රියාශීලී, ආරක්ෂිත ජීවයක් ලබාගැනීමයි. අපි ඒ සඳහා අඛණ්ඩව කටයුතු කරමු."

# රහස් අංකය ඉල්ලූ විට කොළය දෙකට නමා මැසිමට දාලා

■ සරත් හෙට්ටිගේ - හේවාහැට

ගොවිතැන ප්‍රධාන ජීවනෝපාය කර ගත් ගොවි ගම්මානයකි. අද ඒ ගම සරුසාර කෙත්වතුවලින් හෙබි, ඉහළ වී අස්වැන්නක් ලබා දෙන පෙදෙසක්ය.

ගොවි ජනපදය ආසන්නයේ එද කුඩා නගරයක් පැවැති අතර අද එය පුළුල්ව විහිද ගිය මහා නගරයක් බවට පත්ව ඇත්තේය. එනිසාම එහි රාජ්‍ය බැංකු රැසක් හා ප්‍රධාන පෙළේ පෞද්ගලික බැංකු කිහිපයක්ම ස්ථාපිත කර ඇත්තේය.

මෙකී එක් බැංකුවක් සමග නිරතුරු මුදල් ගනුදෙනු කරනු ලබන හැටපස් විය ඉක්මවූ ගොවි මහතෙකි. ඔහු අස්වැන්න විකුණූ වහා ලක්ෂ ගණනින් මුදල් තැන්පත් කිරීමට මෙන්ම වරින් වර මුදල් ලබා ගැනීමටත් බැංකුවට පැමිණෙන්නේය.

මෙපමණ කලක් බැංකු පාස්පොත රැගෙන විත් මුදල් ලබාගත් ඔහු නගරයේ වැඩි වේලාවක් රැඳී නොසිට තම ගම් බිම බලා දිවෙන බස් රථයෙන් පිටවන්නේය.

මෑතක සිට බස් රථයේ කාල වේලාවන් ද වෙනස්වීම නිසා මොහුගේ බැංකු ගනුදෙනුවලට එය බාධාවක් වී තිබිණි. බැංකුවේ පෝලිම් දිගුවීමත් බොහෝ වේලා එහි ගත කිරීමටත් සිදුවීම නිසා මොහු බැංකු නිලධාරිනියකට කියා ඇත්තේ තමාට ඉක්මනින් මුදල් රැගෙන යායුතු බවත් තමාගේ මුදල් කඩිනමින් ලබා ගැනීමට උදව් කරන ලෙසත ය.

මෙහිදී බැංකු නිලධාරිනිය ඔහුට මෙසේ පවසා තිබිණි. "සීයා ට බැංකු කාඩ් එකක් නැද්ද..?'' නැති නම් කාඩ් එකක් ගන්න, එතකොට සීයාට ඕනෑම වෙලාවක බැංකුවෙන් සල්ලි ගන්න පුළුවන් රස්තියාදු වෙන්න ඕනත් නෑ.'' යනුවෙනි.

"සතියේ දවස්වල නැතිව සෙනසුරාද, ඉරිදත් සල්ලි ගන්න පුළුවන් ද නෝනා..? ඔහු බැංකු නිලධාරිනියගෙන් විමසා ඇත.

ඒ අනුව බැංකු නිලධාරිනිය ඔහුට බැංකු කාඩ් පතක් නිකුත් කොට එහි ඇති පහසුකම් පිළිබඳව කරුණු පහද දී රහස් අංකය සහිත ආවරණ කවරය ද ඔහු අත තබා තිබේ.

"මේක ඇතුළේ සීයාගේ රහස්‍ය අංකය තියෙනවා. මෙය නැති කර ගන්න එපා. ඒ වගේම කාටවත් කියන්නවත් දෙන්නවත් එපා. සීයාට පහසු වෙලාවක බැංකුවට ඇවිත් අර තියෙන මැෂින් එකට කාඩ් එක දලා අවශ්‍ය මුදල සඳහන් කරන්න. එතකොට රහස් අංකය ඇතුළත් කරන්න කියාවී. ඊට පස්සේ මේකේ තියෙන රහස් අංකය ඇතුළු කරන්න. අවශ්‍ය මුදල මැෂිමෙන් ලැබේවි.'' යනුවෙන් උපදෙස් ලබා දී තිබුණාය.

ඊට දින කිහිපයකට පසු බැංකුවට පැමිණ ඔහු මුදල් ලබා ගැනීමේ යන්ත්‍රය වෙත ගොස් කාඩ්පත ඇතුළු කර තිබිණි. අනෙකුත් තොරතුරු ද නිවැරැදිව සපයා ඇති අතර රහස්‍ය අංකය ඇතුළත් කරන්නැයි තිරයේ දිස් වූ විට බැංකු නිලධාරිනිය එද ලබාදුන් රහස්‍ය අංකය ඇතුළත් කවරය තුනට හතරට නමා කාඩ්පත ඇතුළත් කළ ස්ථානයෙන්ම යන්ත්‍රය තුළට ඔබා තිබිණි.



මඳ වේලාවක් බලා සිටිය ද මුදල් නොලැබුණු හෙයින් වහාම බැංකුව වෙත ගිය මොහු තමාට මුදල් ලබා ගැනීමට නොහැකි වූ බව පවසා ඇත්තේය.

නිවැරදිව රහස්‍ය අංකය ඇතුළත් කළේ දැයි බැංකුවේ නිලධාරියකු ඒ අවස්ථාවේදී විමසා ඇති අතර ඔහු ප්‍රකාශ කර තිබුණේ මෙවන් පිළිතුරකි. "ඔව් මහත්තයෝ, අමාරුවෙන් තුනට හතරට නමලා මැසිමට දැම්මා. දැම්මා දැම්මාමයි සල්ලි ආවෙත් නෑ දීපු කාඩ් එක ආවෙත් නෑ.'' යනුවෙනි.

ඒ සමග හිනාව නවතා ගැනීමට නොහැකි වූ බැංකු නිලධාරියා ඒ.ටී. එම් යන්ත්‍රය අසලට ගොස් පරීක්ෂා කර තිබිණි. එවෙලේ සිදුව ඇති අලකලංචිය තේරුම් ගෙන "සීයා අද නම් සල්ලි ගන්න බැරිවෙයි. යන්ත්‍රයත් එක්කම හිරවෙලා. අර කොළය දලා. හෙට බැංකු පොතත් අරගෙන එන්න.'' යැයි පවසා ඇති අතර "මදැයි බොත්තම් ඔබලා සල්ලි ගන්න ආවා.'' ..යයි පවසමින් ඔහු යන්නට ගොස් තිබිණි.

අවසානයේ බැංකු නිලධාරින්ට සිදුවූයේ ඒ.ටී.එම්. යන්ත්‍රය යථා තත්ත්වයට පත්කර ගැනීමට කොළඹින් කාර්මිකයකු ගෙන්වා ගැනීමටය.

ඇතින්න මිය යෑමට පෙර ගම්වාසීන් විසින් වතුර ලබා දුන් අයුරු



# කිව්ලේකඩ ඇතින්න බේරන්න ගමේ ඇත්තෝ සද්දන්ත මෙහෙවරක

■ චින්තක ක්‍රිෂාන්ත බාලසූරිය - ගලෙන්බිඳුණුවැව

අලි - මිනිස් ගැටුම් හේතුවෙන් වසරකට ලෝකයේ අලි වැඩි සංඛ්‍යාවක් මිය යන රට බවට ශ්‍රී ලංකාව පත් ව ඇත්තේය. ඒ අතර වන අලින්ගේ පහර දීම්වලට ලක් වී මිය යන මිනිසුන්ද නැතුවාම නොවේ. නමුත් ගලෙන්බිඳුණුවැව, කිව්ලේකඩ ගම්මානයෙන් ඇසුනේ වෙනස්ම කතාවකි.

මෙම ගම්මානයේද බොහෝ දෙනා හේන් ගොවිතැන මූලික ආදයම් මාර්ගය කරගෙන සිටිති. වන අලින්ගෙන් සිදුවන වගා විනාශයන් ද මෙම ගම්මානයට අඩුවක් නොතිබිණි. ඒ අතර ඇතින්නියක්ද මේ ගම්මානය අවට සැරිසරන්නට විණි. අනෙක් වන අලින් මෙන් නොව තම කුස පුරවාගන්නට වගාවකින් කොටසක් ආහාරයට ගන්නවා විනා වගාවටත් දේපළවලටවත් හානියක් නොකිරීමට මෙම ඇතින්නිය වගා බලා ගෙන තිබිණි. ඒ නිසාම ඇතින්නිය කෙරෙහි ගම්වාසීන්ට තිබුණේ මහත් ඇල්මකි.

ඇයගේ හැසිරීම් රටාව හොඳින් හඳුනන ගම්වාසීන්ට ඇතින්නගේ වෙනසක් දකින්නට විණි. ඒ නිසාම ගම්වාසීන් මොරගොඩ බීට්ටු වනජීවි කාර්යාලයට මේ පිළිබඳ දැනුම් දීමට කටයුතු කර තිබුණේය. පසුව එහි පැමිණි වනජීවි නිලධාරීන්ට දැකගන්නට ලැබුණේ කිව්ලේකඩ වැව් ඉස්මත්තේ ඇතින්නිය වැටී සිටින අයුරුය.



වැව් ඉස්මත්තේ වැටී සිටි ඇතින්න

ඒ මොහොතේම ප්‍රතිකාර ආරම්භ කිරීමට අනුරාධපුර පණ්ඩුලගම පශු වෛද්‍ය කණ්ඩායමද එහි පැමිණියේය. ඒ සමගින් එතැනට එක් වූයේ ගම්වාසීන්ය. ඔවුන් මුලින්ම කළේ වැව් ඉස්මත්තේ අව්වේ වැටී සිටින ඇතින්නියට සෙවණක් සෑදීමය. කැලේ කොළ අතු ගෙනැවිත් ඇතින්නියට කෑමට ඒ අසලින්ම එල්ලුවේය. පිපාසෙන් සිටින ඇයට වතුර පෙව්වේද ගම්වාසීන්ගේ දෑතින්ම ය.

ප්‍රතිකාර ආරම්භ කළ වෛද්‍යවරුන් පවසා ඇත්තේ ඇතින්න දින ගණනාවකට පෙර හක්කපටස් ආහාරයට ගෙන නිරාහාරව සිටීම හේතුවෙන් ශරීරය ඉතා දුර්වල වී ඇති බවයි. ඇතින්නිය බේරා ගැනීමට වෛද්‍යවරුන් නොයෙක් උත්සාහ දැරුවත් ප්‍රතිකාර ආරම්භ කර පැය කිහිපයකින් පසු ඇය මියැදෙන්නට වූවාය.

ඇතින්නියගේ අවසන් කටයුතු කිරීමට යෑමේදී සිදුවූයේ ගැටලු සහගත තත්ත්වයකි. ඒ ඇතින්නිය මියගොස් සිටි ස්ථානය වන කිව්ලේකඩ වැව් ඉස්මත්ත අයිති ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය හා ග්‍රාමසේවා වසම තමන්ට පැවරී ඇති රාජකාරි ප්‍රදේශය නොවන බව ග්‍රාම නිලධාරිවරිය පැවසීමත් සමගය. අවසානයේදී ඇතින්නියගේ අවසන් කටයුතු ගලෙන්බිඳුණුවැව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 169 තුලානේ ග්‍රාම නිලධාරිවරිය භාරගනු ලැබුවේ සංවාද මැද්දේය.


කෘත්‍රිම වෙරළ තීරයේ ජල ක්‍රීඩා උපකරණ


කුරුම්බා කඩය


අදහස් දැක්වූ ලකිඳු දැකුම්කලු

# පෝට් සිටියේ කෘත්‍රිම වෙරළට කුරුම්බා කඩයක්

මෙරට විශාලතම සංවර්ධන කලාපය වන කොළඹ වරාය නගර ව්‍යාපෘතියේ ඉදිකිරීම් මේ වන විටත් සිදුකෙරමින් පවතින්නේය. මෙම වරාය නගරය වූ කලී මුහුද ගොඩ කර රටට එකතු කරන්නාවූ භූමියකි. චීන රජයේ ආයෝජනයක් වූ මෙහි මූලික ආයෝජනය ඇමරිකානු ඩොලර් බිලියන එකයි දශම හතරක් සහ සමස්ත ආයෝජන වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන පහළොවකි. මුහුද ගොඩ කිරීමෙන් බිහිකරන හෙක්ටයාර දෙසිය හැට නවයක මෙම භූමි ප්‍රමාණය වත්මන් කොළඹ වාණිජ කලාපයට සම්බන්ධ කිරීමට නියමිතය.

මේ කියන්නට යන්නේ ද කොළඹ වරාය නගරය තැබූ අලුත් පියවරක් ගැනය. ඒ ලංකාවේ ඉදිවූ පළමු කෘත්‍රිම වෙරළ තීරයය. මීට වසරකට පෙර ඉදිකිරීම් ඇරඹූ මෙම කෘත්‍රිම වෙරළ තීරය කිලෝමීටර දෙකක දිගකින් යුක්තය.

කොළඹ වරාය නගරයේ ඉදිවූ නව වෙරළ තීරය කෘත්‍රිමව නිර්මාණය කෙරුණද එය ස්වභාවික පන්නයේ වීම මෙහි ඇති විශේෂත්වයයි. මෙය නැරඹීමේ අවස්ථාව ඕනෑම අයෙකුට හිමි වන අතර සඳහා ගාස්තු අයකිරීමක් සිදු නොකෙරේ.

"ඇත්තෙන්ම අලුතින් ඉදිවූ මෙම කෘත්‍රිම වෙරළ ලාංකික ජනතාවට අලුත් අද්දැකීමක් කියන්න පුළුවන්. ඒ අලුත් අද්දැකීම විඳ ගන්න සති අන්තයේ පවුලේ සැමට එන්න ඇවිල්ලා විඳ ගන්න කියලා ආරාධනා කරනවා. මෙහි පැමිණෙන අය වෙනුවෙන් දෙස් විදෙස් විවිධ කෑම බීම වර්ග ඇතුළත් ආපනශාලාද රැසක් ස්ථාපිත කරලා තියෙනවා. කෑම කඩ විස්සක් විසිපහක් අතර ගණනක් තිබෙනවා'' යැයි කොළඹ වරාය නගරයේ ආපනශාලා ජාලයේ කළමනාකාරිණිය වූ එන්ජිකා ජෝ කෘත්‍රිම වරාය සම්බන්ධයෙන් අදහස් දැක්වමින් කියා සිටියාය.

(artificial beach) ලෙස නම් කර ඇති මෙම වෙරළ ක්‍රීඩා තීරයට පැමිණෙන ඕනෑම අයෙකුට වෙරළ ක්‍රීඩා, ජල ක්‍රීඩා කිරීමේ හැකියාව පවතින අතර ආපනශාල, නිමි ඇඳුම් සාප්පු සංකීර්ණ ඇතුළු වෙළෙඳ සල් රැසක්ද ස්ථාපිත කර තිබේ. ලොව ඉහළ ප්‍රමිතියෙන් යුතු යටිතල පහසුකම්ද මෙහි අන්තර්ගතය.

"අපි ඇත්තෙන්ම මේ කෘත්‍රිම වෙරළ තීරය බලන්න ආවේ ලොකු වෙනසක් තියෙනවා කියලා ආපු ආරංචියට. ඇත්තෙන්ම ළමයින්ට වගේම වැඩිහිටියන්ටත් සතුටු වෙන්න පුළුවන් තැනක්. මෙහි තියෙනවා කුරුම්බා කියලා කඩයක් ඒ වගේම අයිස්ක්‍රීම් කඩ, නූඩ්ල්ස් කඩ විතරක්ම තියෙන කඩ වගේම පොල් අතු වියලා වහල හෙවිලි කළ ලොකු ස්ථානයක්. එතැන ඕනෑම කෙනෙකුට ගිමන්හරින්න වගේම කෑම වර්ග කෑමටත් වෙන්කරලා තියෙනවා. තාම මේ කෑම කඩ ඉදිවෙමින් තමයි පවතින්නේ. රාත්‍රී කෑම කඩ ර. දොළහ වෙනකල් විවෘත කරලා තියෙනවා. ඒ වගේම බෝට්ටු සේවයක් පවා මෙහි තියෙනවා'' යැයි කෘත්‍රිම වෙරළ තීරයේ අද්දැකීම විඳගැනීමට කැලණියනේ පැමිණි කොළඹ ආනන්ද විදුහලේ උසස් පෙළ අංශයේ සිසුවකු වූ ලකිඳු සිත්කලු සිය අදහස් එසේ ප්‍රකාශ කළේය.

මුහුදු මට්ටමමේ සිට මීටර හතරහමාරක උසකින් සහ කිලෝමීටර තුනයි දශම දෙකකින් යුත් දිය කඩනය නිසා විශාල දිය රැළි මෙම කෘත්‍රිම වෙරළ තීරය වෙත පැමිණීම අවම කර තිබීම මෙහි විශේෂත්වයයි. එම නිසා බියක් සැකයකින් තොරව කුඩා දරුවන්ට පවා දිය නෑමේ හැකියාව ද මෙහි ඇත්තේය.


කිලෝමීටර දෙකක දිගින් යුත් කෘත්‍රිම වෙරළ තීරය


චීන අවන්හලක්

# කන්නෙලියේ ඉද්ද මලින් පුරාණ බෝ සමිඳු පිදේ

දීපා වසන්ති එදිරිසිංහ

මුළු මහත් ශ්‍රී ලංකාවටම ආශිර්වාද පතා වාර්ෂිකව සිදුකරනු ලබන ජාතික ඉද්ද මල් පූජාව දහ නව වැනි වරටත් හිනිදුම ශ්‍රී ශාසනෝදයාරාම පුරාණ බෝධීන් වහන්සේ අභියසදී පසුගියද උත්සවාකාරයෙන් සිදු කෙරිණි.

මෙම පින්කම සංවිධාන කර තිබුණේ දෙරණ මාධ්‍ය ජාලයේ ආගමික උපදේශක, ජාතික ඉද්ද මල් පූජාවේ නිර්මාතෘ කඩිහිංගල විනීත හිමියන්ගේ ප්‍රධානත්වයෙනි.

සිංහරාජය හා කන්නෙලිය ආදී වනාන්තරවලින් දිනක් තුළ නෙළා ගන්නා ලද ඉද්ද මල් ලක්ෂ ගණනක් පෙරහරින් රැගෙන විත් බෝධීන් වහන්සේට පූජා කෙරුණේය.

එසේ රැගෙන ආ මල් අඩි විසිහයක් දිග, අඩි හයක් පළල දේශීය අමුද්‍රව්‍ය යොදාගෙන සකසන ලද විශේෂිත මල් අසුනක තැම්පත් කෙරිණි.

භික්ෂූන් වහන්සේලා සියක් නමක් පෙරටු කරගනිමින්, සැදැහැවතුන් දහස් ගණනක් මල් පෙරහර දෙකකින් විහාරස්ථ භූමිය වෙත පැමිණීම කාගේත් සිත්ගත්හ. මෙම පෙරහරේ සංස්කෘතික නැටුම් ආදිය නැතත්, සධාතුක කරඬුන් වහන්සේලා, බුද්ධ ප්‍රතිමා වහන්සේලා පෙරටු කරගනිමින් කොඩි, සේසත්, හේවිසි කණ්ඩායම් ඇතුළුව මල්වලින් අලංකාරවත් කෙරිණි.

බෝධි පූජාව ආරම්භ වීමට ප්‍රථම ගලිගමුවේ ඤාණදීප හිමියන් විසින් පැමිණි පිරිස වෙත ධර්මානුශාසනාවක්ද සිදු කළහ.


ඉද්ද මල් අසුරා තිබූ විශේෂිත මල් අසුන


කඩිහිංගල විනීත හිමියෝ මල් අසුන සකසමින්

# වයඹ ගස් 'ගම් සිතියමකට'

ඉනෝකා දමයන්ති - වාරියපොළ

ස්වාභාවික පරිසරයේ දක්නට ලැබෙන දේවල් අතර ගස්වලට හිමිවන්නේ ප්‍රධාන තැනකි. මේ ගස්වැල් 'තුරුලිය' නමින් ද හඳුන්වන්නේය. වාතය, ජලය, ආහාර යන සියල්ල ලබා දෙන්නේ ද මේ කියන ශාක වලිනි. එවන් වූ වටිනාකමක් ඇති ගස් වැල් පිළිබඳ විශේෂ සංගණනයක් "තුරු සුමිතුරු'' මගින් සිදු කෙරුණේ වයඹ පළාත කේන්ද්‍ර කර ගනිමින්ය.

එම සංවිධානය හරහා රටපුරා ඇති වටිනා ගස්වැල් සංගණනය කරමින් ග්‍රාමීය කමිටු වෙත සුරැකීමට බාර දීම මෙම වැඩසටහනේ මූලික අරමුණයි.


මෙහිදී දැනට රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිතව ඇති ඉතා පැරණි ගස් වැල්, පරිසර සමතුලිතතාවට සංවේදී ගස්වැල් සහ වඳවී ගෙන යන ලැයිස්තුවට අයත් ගස්වැල් තෝරාගෙන ඒවා සංගණනයකට ලක් කර තිබේ. පසුව එම ගස්වැල් ඉදිරියට රැකබලා ගැනීම සඳහා එම ප්‍රදේශවල ජීවත්වන ගම්වාසීන් ඒකරාශී කර සාදගත් "තුරු සුමිතුරු'' ග්‍රාමීය එකමුතුවකට පැවරීම සිදු කෙරේ. මෙහි මුල්ම වැඩසටහන නිකවැරටිය, සියඹලෑව ගම්මානයෙන් ආරම්භ කෙරිණි. එය දීපව්‍යාප්තව කිරීමට සැලසුම් කර ඇත්තේය.

මේ සඳහා ගනේවැව පුරාණ විහාරාධිපති ගලපිටියාගම වජිරවංශ හිමි සහ නිකවැරටිය ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ ප්‍රධාන ලේඛකාධිකාරි බුදුමුත්තාව රජමහා විහාරාධිකාරි තඹරොඹුවේ පදුමජෝති හිමි, නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් රේණුකා විජයරූපා ඇතුළු රාජ්‍ය නිලධාරීහු ගස් වැල් සංගණනයට එක්ව සිටියහ. අනතුරුව එම ගස්වැල්වලට අංකයක් ලබාදී රැස්ව සිටි පිරිසට එම ගස් සුරැකීමේ වගකීම් බාර දුන්හ. සංගණනයට එක් කෙරෙන ගස් අවසානයේදී ගම් සිතියමක ලකුණු කර එය ගම මධ්‍යයේ ප්‍රදර්ශනය කිරීමටද සැලසුම් කර තිබුණේය. ගම් සීමාවේ සියලු ගස් සංගණනයෙන් අනතුරුව එය "තුරු සුමිතුරු'' වෙබ් පිටුවට සහ ගූගල් සිතියමටද එක් කිරීමටද නියමිතය.

මෙම වැඩසටහන මගින් දැනට නිරවුල්ව නොමැති රක්ෂිත ප්‍රදේශ හඳුනා ගැනීම ද සිදු කෙරේ. ඒ සඳහා ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිවරයාගේ සිට දිස්ත්‍රික් ලේකම්වරයා දක්වා වූ රාජ්‍ය නිලධාරීන්ගේ සහාය ලබා ගැනීමට අදහස් කර ඇත්තේය.

කවුරුන්හෝ මෙම පරිසර සත්කාරක වැඩසටහන සමග එක්ව ගස්වැල් සංගණනයක් සිදුකිරීමට කැමැත්තක් දක්වන්නේ නම් "තුරු සුමිතුරු'' ෆේස්බුක් පිටුවට එක්වීමෙන් හෝ thurusumithuruwe4@gmail.com යන විද්‍යුත් ලිපිනය හරහා වැඩි විස්තර ලබාගත හැකිය.


වටිනා ගස් අංකනය කරමින්


170
සුමතිපාල- ජෝතිපාල

01 වැනි පිටුවෙන්...

## මණ්ඩලෙන් මාලිගාවට...

(13,299,010.00) කෙසේ නමුත්, පෙරහරට අදාළව විදුලි ආලෝකකරණයට ඉකුත් වසරේ (2022) ඇස්තමේන්තු ගත මුදල රුපියල් ලක්ෂ 90 කි.



දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දෑල

විදුලි ආලෝකකරණයේදී ශ්‍රී දළදා මාලිගාව සඳහා රුපියල් ලක්ෂ 34 ක්ද, ශ්‍රී නාථ දේවාලය සඳහා රුපියල් ලක්ෂ 11 ක්ද, ශ්‍රී විෂ්ණු දේවාලය සඳහා රුපියල් ලක්ෂ 13 ක්ද, ශ්‍රී කතරගම දේවාලය සඳහා රුපියල් ලක්ෂ 11 ක්ද, ශ්‍රී පත්තිනි දේවාලය සඳහා රුපියල් ලක්ෂ 11ක්ද ඇස්තමේන්තු ගතකර ඇත. එමෙන්ම, මහනුවර නගරය තුළ පෙරහර ගමන් ගන්නා සියලුම වීදි ආලෝකකරණය සඳහා ඇස්තමේන්තු ගතකර තිබෙන මුදල රුපියල් ලක්ෂ 44 කි.

විදුලි බිල ගෙවන ආකාරය සම්බන්ධව ශ්‍රී දළදා මාලිගාව, සිවු මහා දේවාල ඇතුළු රාජ්‍ය ආයතන එක්ව සාමූහිකව තීරණයක් ගතයුතු බවද දියවඩන නිලමේවරයා පැවසුවේය.

“පෙරහරට අදාළව ලංකා විදුලි බල මණ්ඩලය විසින් සෑම වසරකදීම ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනවා. එය වෙනද වගේ නොවෙයි සක්‍රීයව එවලා තිබෙනවා. මේ විදුලි බිල දරන ආයතන කීපයක් තිබෙනවා. ශ්‍රී දළදා මාලිගාව, සතර මහා දේවාල, මහනුවර මහ නගර සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය එම ආයතනයි. මේ සම්බන්ධයෙන් සියලුදෙනා එකතු වෙලා බිල ගෙවන ආකාරය සම්බන්ධයෙන් සාමූහික තීරණයක් ගත යුතුයි.'' යැයිද දියවඩන නිලමේවරයා කීවේය.

විදුලි බිල සම්බන්ධ ගැටලුව සාකච්ඡා මට්ටමින් විසඳ ගැනීමට බලාපොරොත්තු වන බවද ඔහු පැවසීය.

## 50%ක තෙල්...

මේ වන විට පිරවුම්හල් 770කට මේ බව දන්වමින් ලිපි යොමු කර ඇති බව ඔහු අරුණ කළ විමසුමකදී පවසා සිටියේය.

එම පිරවුම්හල් තවදුරටත් සියයට පනහක ඉන්ධන සංචිතයක් පවත්වාගෙන නොයන්නේ නම් ඒවා ඛනිජ තෙල් සංස්ථාව භාරයට ගන්නා බවද කළමනාකාර අධ්‍යක්ෂවරයා පැවසීය.

මේ වන විට එම නීතීන්වලට අනුගත නොවූ රාජගිරියේ පිහිටි ඉන්ධන පිරවුම්හලක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පාලනයට ගෙන ඇත.

එමෙන්ම යාපනයේ කරෙයිනගර්හි පිහිටි ඉන්ධන පිරවුම්හලක්ද ඛනිජ තෙල් නීතිගත සංස්ථාව භාරයට ගැනීමට කටයුතු කරන බව ඔහු වැඩිදුරටත් අවධාරණය කළේය.

## අරගලයේ සිටි ...

මෙම ප්‍රකාශයට මාගේ මව සහ පියා මතක් කර ඔවුන් තමාට බණිනු ඇති බවද හෙතෙම කීවේය.

මාතලේ පෙරේද (15 වැනිදා) පැවති වැඩසටහනකදී මන්ත්‍රීවරයා ප්‍රකාශ කළේ තරුණ පරම්පරාව නොමග යැවූ එකම පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ බවත් දැන් වෙනස් වී ඇත්තේ පක්ෂයේ නම සහ ලාංඡනය පමණක් බවත්ය.

එහිදී වැඩිදුරටත් හෙතෙම මෙසේද කීය.

"අරගලයෙන් කෝටි ප්‍රකෝටිපතියෝ වුණේ රට හදන්න, සංස්කෘතිය රකින්න කියන උදවියයි. තරුණ පරම්පරාව තුවක්කු සංස්කෘතියට තල්ලු කළා. ගිනි අවියට පපුව දෙන්නේ තරුණයෝ. උසි කපුටෝ හැංගිලා බේරෙනවා. මේක තමයි ජේ.වී.පියේ සංස්කෘතිය." යැයිද මන්ත්‍රීවරයා සඳහන් කළේය.

මන්ත්‍රීවරයා වැඩිදුරටත් මෙසේද කීය.

"ඔවුන්ගේ ඩීල් දේශපාලනය දෙබිඩි පිළිවෙත ජනතාව හඳුනනවා. 78දී ජේ.ආර්ට උදව් කළා. 71දී තරුණයෝ 1200ක් රටට අහිමි කළ ජනතා විමුක්ති පෙරමුණ 87 - 88 තරුණ ජීවිත හැට දහසක් රටට අහිමි කළා. ගංගාවල පා කළා. ටයර් සෑවල පිච්චුවා. ජේ.ආර්.ට එරෙහිව ප්‍රේමදාසට උදව් කළා. ඊළඟට චන්ද්‍රිකාට උදව් කළා. මහින්ද රාජපක්ෂට උදව් කළා. මේ තමයි ඔවුන්ගේ නියම ඩීල් දේශපාලනය. අනුර ඔබගේ ක්‍රමය රටේ ජනතාවට කියන්න. පාර්ලිමේන්තුව ගිනි තියන්න ගියා ලාල් කාන්ත සහ සුනිල් හඳුන්නෙත්තිටයි අඩුම තරමේ සුළු පැමිණිලි අංශයටවත් කැඳවලා නැහැ. අනුර ඔබගේ බොරු දැන් දැන් කරළියට එනවා. ඩොලර්වලට යටවූ පිරිසක් රට විනාශ කරන්නේ. පොහොට්ටුව තියෙන කල් පැසිස්ට්වාදයට ඉඩ දෙන්නේ නැහැ. ජනතාවගේ ශක්තියෙන් ඔවුන් මෙල්ල කරනවා. වසර 15-20 වරක් රටට උරුම කළේ දෙබිඩි ඩීල් ඝාතන සංස්කෘතිය. මම අභියෝග කරනවා අනුරට මම කියන්නේ බොරු නම් උත්තර දෙන්න. ඔබලාගේ රට හදන ක්‍රමවේදය මොකක්ද උත්තර දෙන්න කියලා.





# ළමා අපරාධ සම්බන්ධ චක්‍රලේඛය පොලිසිය පැහැර හැරලා

■ නිලන්ත මදුරාවල


ළමයින් සම්බන්ධයෙන් අපරාධයක් වාර්තා වී පැය විසිහතරක් ඇතුළත ඒ බව ජාතික ළමාරක්ෂක අධිකාරියට දන්වන ලෙස පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ සභා කාර්යාංශය විසින් පොලිස්පතිවරයාට ලිඛිතව දැනුම් දී ඇත.

මේ බව දන්වා ඇත්තේ එවැනි අපරාධ පිළිබඳව පැය විසි හතරක් ඇතුළත ජාතික ළමාරක්ෂක අධිකාරියට දැනුම් දිය යුතු බවට වන මීට වසර තුනකට පෙර පොලිස්පතිවරයා නිකුත් කර තිබෙන ආර්.ටී.එම්. 917 දරන චක්‍ර ලේඛය නිසි පරිදි ක්‍රියාත්මක නොවන බවට පාර්ලිමේන්තුවේ ළමයින්, කාන්තාවන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ දී අනාවරණය වීමෙන් පසුය.

බොහෝ පොලිස් ස්ථාන එම චක්‍ර ලේඛය පැහැර හරිමින් සිටින බවත් එම කාරක සභාවේ දී හෙළි වී තිබේ. එලෙස වගකීම පැහැර හරින පොලිස් ස්ථාන සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කළ යුතු බවට ද එහිදී සාකච්ඡා කර ඇත.

ළමයින් සම්බන්ධ අපරාධ නියාමනය හා ඒ සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් පවත්වා ගැනීමේ පූර්ණ වගකීම ඇත්තේ ළමාරක්ෂක අධිකාරියට වන නමුත් ඉහත කරුණු හේතුවෙන් නියාමනය පමණක් නොව දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමේ කාර්යය ද නිසි පරිදි ක්‍රියාවට නැගීමට නොහැකි වී ඇත.

මෙම තත්ත්වය යටතේ ඉහත චක්‍ර ලේඛය සම්බන්ධයෙන් සියලුම පොලිස් ස්ථාන දැනුවත් කරන ලෙසත් එම වැඩපිළිවෙළ නිසි ලෙස ක්‍රියාත්මක වන්නේ ද යන්න පසුවිපරම් කිරීමට නිලධාරියෙක් පත් කරන ලෙසත් ආංශික අධීක්ෂණ කාරක සභාව පොලිස්පතිවරයාට යැවූ ලිපියේ සඳහන්ව තිබේ.



01 වැනි පිටුවෙන්...

## මම බයවෙලා...

තමා එම අභියෝග භාර ගන්නවා මිසක් ඒවාට බිය වී දුවන කෙනෙක් නොවන බවත් ඇමැතිවරයා සඳහන් කළේය.

එම නිසා වැදගත් වන්නේ අමාත්‍යාංශය නොව එහි පවතින වගකීම බව මැණික්හින්න රඹකැන් උත්සව ශාලාවේ ඊයේ (16 වැනිදා) පැවති ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කුණ්ඩසාලේ ආසන බල මණ්ඩල රැස්වීමේදී හෙතෙම කීවේය.

"මේ මගේ 8 වැනි අමාත්‍යාංශය. නමුත් මට සෞඛ්‍ය අංශය පැත්තෙන් විශාල වගකීමක් පවතිනවා. දැනට ක්‍රියාත්මක වන යම් යම් දේවල් නීතිමය වශයෙන් ඔප්පු කර පෙන්වීමට අවශ්‍ය පියවර ගන්නවා. ඕන නම් පාර්ලිමේන්තුවේ දෝෂාභියෝගයක් ගේන්න. මම ඒකට මුහුණ දෙන්න සූදානම්. මොනවා කළත් දෙන වගකීම හරියට ඉටු කරන බව කියන්න ඕන. ජනතාව වෙනුවෙන් ජනතාවගේ සේවාවන් නිවැරදිව ඉටු කරනවා" යැයිද ඇමැතිවරයා පැවසීය.

## වසීම් අක්‍රම්ගේ කඩේ...

මරදන්ඩකවල පදිංචි 31 හැවිරිදි එම්. වසීම් අක්‍රම් නමැති ව්‍යාපාරිකයා ඉකුත් 14 වැනිද රාත්‍රී තමන් වෙළෙඳ සැල වසා දමා නිවසට ගිය අවස්ථාවේ එහි වහලයේ ෂීට් ඉවත් කර ඇතුළු වූ අයකු මෙම කෘෂිබීජ තොගය සොරාගෙන ගොස් ඇති බව පැමිණිල්ලේ සඳහන්ය.

මෙහි විවිධ වර්ගයේ කෘෂිබීජ තිබී ඇති අතර එහි වටිනාකම රුපියල් එක්කෝටි හතළිස් හතරදහස් දෙසියපනහක් (1,044250) ක් බවද සඳහන්ය.

මෙම සොරකමට සම්බන්ධ සැකකරුවන් මෙතෙක් අත්අඩංගුවට ගෙන නොමැති අතර මරදන්කඩවල පොලිසිය මගින් ඒ පිළිබඳ ඉදිරි විමර්ශන සිදුකෙරේ.

## කොටලීයේ පෙරළුණේ ...

කදුරුවෙල සිට කාත්තාන්කුඩි දක්වා පසුගිය (09 වැනිදා) රාත්‍රියේ ගමන් ආරම්භ කළ බස් රථයක් මෙලෙස අනතුරට ලක්ව තිබුණේ පස්වරු 07.20ට පමණය.

අනතුර සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් නිශාන්ත අනුරුද්ධ වීරසිංහගේ උපදෙස් මත සහකාර මෝටර් රථ කොමසාරිස් (කාර්මික) සුජීව තෙන්නකෝන් විසින් මහනුවර ප්‍රධාන මෝටර් රථ පරීක්ෂක මහින්ද අධිකාරීගේ ප්‍රධානත්වයෙන් යුත් සිවු පුද්ගල මෝටර් රථ පරීක්ෂක කණ්ඩායමක් පත්කරනු ලැබීය.

මේ අනුව මගීන්ගෙන් ලබාගත් ප්‍රකාශ මත බස් රථය අපරීක්ෂාකාරී අන්දමින් ආන්ත්‍රාදායක පාලම මතින් ගමන් කර තිබෙන බව හෙළි වූ අතර කාර්මික පරීක්ෂා කිරීම්වලදී බස් රථයේ ඉදිරිපස දුණුකොළයේ දකුණු පස ප්‍රධානම දුනු තහඩුව කැඩී ගොස් ඇති ආකාරයත්, ප්‍රධාන දුනු කොළයේ තැන් දෙකක් පෙරාතුවම බිඳීගොස් පැස්සුම් යොදා තිබෙන ආකාරයත් නිරීක්ෂණය වී ඇත.

එමෙන්ම බස් රථය පසුගිය ජූනි මාසයේදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්මික මධ්‍යස්ථානයකින් යෝග්‍යතා සහතිකයද ලබාගෙන ඇති බවත් ඒ අනුව ආදායම් බලපත්‍රය ලබාගෙන මගී ප්‍රවාහනයේ නියැළී තිබෙන බවත් අනාවරණය වී ඇත.

මෙම බස් රථයේ දුනු කොළයේ ස්ථාන දෙකක් බිඳී ගොස් ඇත්තේ මාසයක් වැනි කෙටි කාලයකින් නොවන හෙයින් මෙයට යෝග්‍යතා සහතිකයක් ලබාදී තිබීම ගැන ගැටලුකාරී තත්ත්වයක් පවතින බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ උසස් ප්‍රකාශකයෙකු සඳහන් කළේය.

## ඒඩ්ස්වලින් බේරෙන්න...

පුද්ගලයකුගෙන් තවත් පුද්ගලයකුට එච්.අයි.වී. ඒඩ්ස් සම්ප්‍රේෂණය වීම වැළැක්වීම වෙනුවෙන් ඖෂධයක් ලබාදීමට ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන ඒකකය වැඩසටහනක් ආරම්භ කර තිබේ.

මෙම වැඩසටහන යටතේ PrEP නම් ඖෂධය නොමිලයේ ලබා දෙන අතර එමගින් අනාරක්ෂිත ලිංගික හැසිරීමේදී පුද්ගලයකුගෙන් තවත් පුද්ගලයකුට ඒඩ්ස් සම්ප්‍රේෂණය වීම වැළැක්වීමේ හැකියාවක් ඇතැයි ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන ජාතික වැඩසටහනේ අධ්‍යක්ෂ ජානකී විදානපතිරණ පැවසීය.

මෙම ඖෂධය පෙරවරු 9.00ත් 1.00ත් දක්වා කාලයේදී අංක 29, ද සේරම් පෙදෙසේ පිහිටි ඉරිදා දින සායනයෙන් නොමිලයේ ලබාගත හැකිය.

## සාජන් ගෙදර යන ගමන්...

පොලිස් සැරයන්වරයා මෙම කාන්තාව සමග කළ ගණුදෙනුවක ආරවුලක් මත ඇයට මෙසේ මාංචු දමා පොලිසියට ඇදගෙන විත් තිබේ.

වත්තල පොලිසියේ චෝදනාගාරය අසල කාන්තාවක් කෑ ගසමින් සිටින ශබ්දය ඇසී පොලිස් ස්ථානාධිපතිවරයා එහි යන විට මෙම කාන්තාව නළලේ ලේ වහනය වෙමින් සිට ඇත. ඒ වන විටත් ඇයගේ අත්වලට විලංගුද දමා තිබී ඇත.

පොලිස් සැරයන්වරයාද ඒ අසලම සිට ඇති අතර ඔහු ජා ඇල පොලිසියට අනුයුක්තව කුරුඳුවත්ත පොලිසියේ විශේෂ රාජකාරි යොදවා සිටි අයකු බව හෙළි වී ඇත. රාත්‍රී රාජකාරි විවේකයෙන් පසු නිල ඇඳුමින් නිවස බලා යන අතරේ මෙම පහරදීම කර තිබෙන බව හෙළිවීමෙන් පසුව ඔහු අත්අඩංගුවට ගෙන තිබේ.

## කෙහෙළියට විතරක් නොව...

ඔහු මේ බව කියා සිටියේ ඊයේ (16 වැනිද ) කොළඹදී පැවැති මාධ්‍ය සාකච්ඡාවක් අමතමිනි.

වැඩිදුරටත් අදහස් දක්වමින් හිටපු මන්ත්‍රීවරයා මෙසේද පැවසීය.

“අපේ රටේ දවසගානේ නිර්මාණය වන අර්බුද කෙළවර වෙන්නේ ජීවිතවලින්. අපේ රටේ නිදහස් සෞඛ්‍ය සේවය මේ අවුරුදු දෙකහමාරක කාලයේදී විශාල අර්බුදවලට මුහුණ දී තියනවා. ඇමැතිවරයාට කළමනාකරණය කරගන්න බැරි නිසාත් දූෂිත නිලධාරීන් මේවාට සම්බන්ධ වීම නිසාත් සමස්ත සෞඛ්‍ය සේවය විශාල පසුබෑමකට ලක්වෙලා.

සෞඛ්‍ය සේවය නියාමනය කරන්න ඇති ආයතන පවා අද වන විට බහුජාතික සමාගම් ගිලගෙන තියෙනවා. පෞද්ගලික රෝහල් නියාමනයට ආයතනයක් තියෙනවා. එය පෞද්ගලික රෝහල්වල අකටයුතුකම් වෙනවා නම් ඒ ගැන පැමිණිලි කරන්න තියෙන ආයතනය. ඒකට ගිහින් පැමිණිලි කළාම ඒ ආයතනය ගන්නෙ පෞද්ගලික රෝහල් හිමියාගේ පැත්තයි. රෝගියාගේ පැත්ත නෙවෙයි. ඒ ආයතනයත් පිරිහිලා ගිහින්. එයත් පෞද්ගලික රෝහල් මාෆියාවේ ග්‍රහණයට ලක්වෙලා. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවත් රෝගීන්ගේ පැමිණිලි විභාග කරන්නෙ නැහැ. වෛද්‍ය සභාව ඉන්නෙ රෝගීන්ගෙ පැත්තෙ නෙවෙයි. රෝගීන්ට අසාධාරණකම් කරන වෘත්තියවේදීන්ගේ පැත්තෙයි ඉන්නේ. එතනත් ජනතාවට හව්හරණක් නැතිවෙලා.

ඖෂධ නියාමන අධිකාරිය අද බහුජාතික සමාගම්වල තැරැව්කරුවන් බවට පත්වෙලා. බහුජාතික සමාගම්වලට අවශ්‍ය දේවල් ගන්න තීන්දු කරන ආයතනයක් බවට එය පත්වෙලා. ජනතාවගේ සුබ සිද්ධියට සෞඛ්‍ය ඉස්සරහට ගෙනියන්න ඇති ආයතන ඉන්නේ ව්‍යාපාරිකයන්ගේ පැත්තේ.

අද ජනතාවට රෝහලකින් අසාධාරණයක් වුණාම පැමිණිලි කරන්න තැනක් නැහැ. පැමිණිලි කළත් වැඩක් නැහැ. ඒ අය ඉන්නේ රෝගීන්ගේ පැත්තෙ නෙවෙයි. ජනතාවට සාධාරණය ඉෂ්ට කරන්න තැනක් නැතිවෙලා. එය බරපතළ තත්ත්වයක්.


පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම විපක්ෂ මන්ත්‍රී කණ්ඩායම් සමග සෞඛ්‍ය ඇමැතිවරයාට එරෙහි විශ්වාසභංගය සම්බන්ධයෙන් විපක්ෂ නායකවරයා සඳුද දින සිට සාකච්ඡා ආරම්භ කරනවා. අපි මේ යෝජනාව ගේන්නේ සෞඛ්‍ය ඇමැතිට විතරක් නෙවෙයි රාජපක්ෂ - වික්‍රමසිංහ ආණ්ඩුවට එරෙහිවයි. මොකද කැබිනට් මණ්ඩලයම මෙයට වගකියන්න ඕනෑ. සෞඛ්‍ය ඇමැතිවරයාගේ වැරැදි තීන්දු වෙන්න පුළුවන්. ඒත් අවසානයේදී කැබිනට් මණ්ඩලය සාමූහිකව වගකියන්න ඕනෑ.” යැයිද හෙතෙම පැවසීය.

## අධිනීතිඥයාගේ...

නියෝජ්‍ය පොලිස්පතිවරයකු දුරකථනයෙන් සම්බන්ධ කර දෙන ලෙසට රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයකු දුන් නියෝගයට පිටුපා රාජකාරි ස්ථානය තුළ නිදාගෙන සිටි බවට චෝදනාවට ලත් නීතිපති දෙපාර්තමේන්තුවේ පොලිස් මුර පොළේ කොස්තාපල්වරයකුගේ වැඩ තහනම් කර ඇත.

රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා පොලිස් මුර පොළ අමතා තමන්ට විශේෂ කාර්ය බළකායේ නියෝජ්‍ය පොලිස්පතිවරයා දුරකථන ඇමතුමකින් සම්බන්ධ කර දෙන ලෙසට ඉල්ලීමක් කර ඇත.

එහිදී එයට ප්‍රතිචාර නොදක්වා රාජකාරි ස්ථානය තුළ නිදාගෙන සිටි බව චෝදනාවට කොස්තාපල්වරයා වැඩ තහනමට ලක්කර තිබේ.





# අවුරුද්දකට සමථ මණ්ඩලවලට ආරවුල් ලක්ෂ 3ක්

## වැඩියෙන් එන්නේ සල්ලි ප්‍රශ්න

■ ඉෂාර රත්නකාර

දිවයින පුරා පිහිටි සමථ මණ්ඩල වෙත වසරකට ආරවුල් ලක්ෂ තුනකට ආසන්න ප්‍රමාණයක් ලැබෙන බව අධිකරණ අමාත්‍යාංශය සඳහන් කරයි.

මෙම වසරේ මැයි 31 වන දින තෙක් පමණක් සමථ මණ්ඩල වෙත ආරවුල් 99,849ක් යොමු වී ඇතැයි ද ඉන් වැඩිම ආරවුල් ප්‍රමාණයක් මුදල් සම්බන්ධ ආරවුල් වන බවද අධිකරණ අමාත්‍යාංශය සඳහන් කරයි. එම සංඛ්‍යාව 63,444කි.

2023 වසරට අදාළ ලද ආරවුල්වලින් 70%ක් පමණ මේ වන විට නිරවුල් කර තිබෙන බවද අධිකරණ අමාත්‍යාංශය සඳහන් කරයි.

මෙම වසරේ මැයි 31 වන දින දක්වා වැඩිම ආරවුල් බස්නාහිර පළාතෙන් යොමුවී ඇති අතර එම සංඛ්‍යාව 20460කි. උතුරු මැද පළාත තුළින් ආරවුල් 12899ක්, වයඹ පළාතෙන් ආරවුල් 12700ක්, මධ්‍යම පළාතෙන් ආරවුල් 11700ක්, දකුණු පළාතෙන් ආරවුල් 11271ක්, සබරගමුව පළාතෙන් ආරවුල් 9357ක්, ඌව පළාතෙන් ආරවුල් 8394ක්, නැගෙනහිර පළාතෙන් ආරවුල් 6997ක්, උතුරු පළාතෙන් ආරවුල් 5985ක් සමථ මණ්ඩල වෙත යොමුව තිබූ බවද අධිකරණ අමාත්‍යාංශය සඳහන් කරයි.

සමථකරුවන්ගේ සේවය අගයන ජාතික සමථ දින 33 වැනි සැමරුම් උත්සවය අධිකරණ අමාත්‍යාංශයේදී අද (17 වැනිදා) පැවැත්වීමට නියමිත අතර, ඒ සඳහා අධිකරණ ඇමැති ආචාර්ය විජයදාස රාජපක්ෂ, රාජ්‍ය ඇමැති අනුරාධ ජයරත්න, සමථ මණ්ඩල කොමිෂන් සභාවේ සභාපති විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු හෙක්ටර් එස්. යාපා සහභාගි වීමට නියමිතය.

# උගුරේ හිරවුණු කෙසෙල් කැබැල්ලෙන් පුංචි ගිත්මිණිගේ දිවිය නවතී



මියගිය දැරියගේ දේහය

## ගම්පහ රෝහලේ දැඩි සත්කාරයේ දින පහක්



මියගිය ගිත්මිණි

**දොම්පේ කෑරගල පුටුපාගල පදිංචිව උන් පුංචි ගිත්මිණි තවමත් වයස අවුරුදු අටක ළදැරියක් වූවාය. දෙකටන ප්‍රාථමික විද්‍යාලයේ තුන්වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ ඈ පාසලේ කා අතරත් ප්‍රසිද්ධව සිටියේ ඉගෙනුමට දක්ෂ දැරියක ලෙසය. තුනේ පන්තියේ මිතුරු මිතුරියන්ට ඈ හොඳ යෙහෙළියක්ද වූවාය.**

සතියේ දිනවල පාසල් ගිය ගිත්මිණි සති අන්තයේ දහම් පාසල් යන්නත් අමතක නොකළාය. ගැහැනු දරුවන් සිවු දෙනකුගෙන් යුතු පවුලේ තුන්වෙනි දරුවා වූ ඇය දහම් පාසල් ගියේ පොඩි අක්කා වූ ඔෂදිත්, පුංචි නංගි වූ සඳලිත් සමගය. ඔවුන් ගියේ නිවෙසේ සිට මීටර පන්සීයක් පමණ දුරින් පිහිටි පුටුපාගල ගමේ ශ්‍රී ශාසනාලෝක ධර්මායතනයටය. ඉකුත් 9 වැනිදත් පිරුවට හැඳ ගත් සහෝදරියන් තිදෙනා සුපුරුදු පරිදි දහම් පාසල් යන්නට පිටත් වූහ. එහෙත් වෙනද මෙන් නොව ගිත්මිණි දැරිය එද දහම් පාසල් යන්නට මැලි වූයේ කිසියම් විපැත්තියක පෙරනිමිත්තක් ඇයට දැනුන නිසා විය හැකිය. අම්මාගේ පෙරැත්තය නිසාම අක්කාත් නංගීත් සමග පිටත්ව ගිය ඈ කිසිදු වෙනසක් නොමැතිව දහම් පාසලේ මිතුරු මිතුරියන් සමග සුපුරුදු ලෙස කල් ගත කළාය.

ශ්‍රී ශාසනාලෝක දහම් පාසලේ දරු දැරියන්ට කාලයක සිටම දහවල් විවේක වේලාවේදී කෙටි ආහාර වේලක් ලබා දෙන්නට ගුරු මණ්ඩලය පුරුදු වී සිටියහ. එදත් ඔවුන්ට කෙසෙල් ගෙඩියක් සමග කෙටි ආහාරයක් ලැබුණි. පුංචි ගිත්මිණි ඇගේ මිතුරියන් සමග ඇයට ලැබුණු ආහාරය රස විඳින්නට පටන් ගත්තාය. ඒ කෑම වේල ඇය ගත් අවසාන ආහාරය බව ඇය නොදැන සිටියා විය හැකිය. ඇගේ ඉරණම තීරණය කරන්නට වැඩි වේලාවක් ගත නොවිණි. කෙසෙල් කැබැල්ලක් ඇගේ උගුරෙහි සිර වූයේ නිමේෂයකිනි. හුස්ම ගැනීමට නොහැකිව ඈ ලතැවෙද්දී දහම් පාසලේ ගුරුභවතුන් ගිත්මිණිගේ උගුරේ සිරවුණු කෙසෙල් කැබැල්ල පිටතට ගැනීමට උත්සහ කළහ. එහෙත් ඔවුන්ගේ උත්සාහය ව්‍යාර්ථ විය. හනි හනිකට දැරිය ඔසවාගත් ගුරුවරු ඇය දෙම්පේ රෝහලට රැගෙන ගියේ ගිත්මිණීට යාන්තමින් හුස්ම වැටෙද්දීය. දෙම්පේ රෝහලේදී ඇයට කෘතිම ශ්වසනය දුන්නාය. ඇගේ උගුරෙහි සිරවුණු කෙසෙල් කැබැල්ල පිටතට ගත්තද ඇය ඒ වන විට සිටියේ ජීවිතයත් මරණයත් අතර සිරවෙලාය.

පුංචි ගිත්මිණිව ගම්පහ දිස්ත්‍රික් මහ රෝහලට යවන්නට වෛද්‍යවරු තීරණය කළේ එහෙයිනි. එහිදී ඇය දැඩි සත්කාර ඒකකයට යොමු කෙරිණි. එහෙත් කිසිදු හැල හොල්මනක් නොමැතිව දින පහක් තිස්සේ ගම්පහ මහ රෝහලේ ප්‍රතිකාර ලැබූ ඈ ඉකුත් 14 වැනි සිකුරාදවේ සදහටම දෑස් පියාගත්තේ දෙකටන ගම්මානයම කඳුලෙන් තෙත් කරවමිනි.

## මොළයට ඔක්සිජන් ගමන් කිරීම අවහිර වීමෙන් සිදුවූ මරණයක්

### මරණ පරීක්ෂණයේදී හෙළිවේ


පෞද්ගලික ආයතනයක සේවය කළ ඇගේ තාත්තා වන චමින්ද පුෂ්පකුමාරට මෙන්ම අම්මා වන දිල්රුක්ෂි නිමාතිට සිය තුන්වැනි දරුවා වූ ගිත්මිණි හේෂාරාගේ හදිසි මරණය ඉමහත් කම්පනයක් ඇති කළේය. සිය බාල නැගණිය වූ ගිත්මිණි කාලයක පටන් අධික සෙම් රෝගයෙන් පෙළුණු නිසා දිගින් දිගටම ඖෂධ පාවිච්චි කළ බව වැඩිමහළු අක්කා වන තරුෂි අහිංසා කීවාය.

ගිත්මිණිගේ පශ්චාත් මරණ පරීක්ෂණය ගම්පහ මහ රෝහලේදී කළ අතර එහිදී කියැවුණේ මොළයට ඔක්සිජන් ගමන් කිරීමේ අපහසුතාවක් හේතුවෙන් ස්නායු ක්‍රියාකාරිත්වය අඩපණ වී ඇය මියගොස් ඇති බවය.

අකාලයේ මිලින වූ ගිත්මිණි දැරියගේ අවසන් කටයුතු දෙකටන පුටුපාගල පොදු සුසාන භූමියේදී ඊයේ(16 වැනිද) මළහිරු බසින සැන්දෑ යාමයේදී සිදු කෙරිණ.

■ අනීෂා මානගේ

■ ආරියපාල විදානගම - දෙම්පෙ



ගිත්මිණි පවුලේ අය සමග

# මූඩියක් උගුරේ හිරවී බිළිඳකු මියයාමේ සිද්ධිය



මියගිය දැරිය

## ළමයගෙ ඇස් වැහිලා ලේයි, සෙමයි ගලන්න ගත්තා

### - මිත්තණිය

මම වත්තේ තේ දළු නෙල,නෙලා හිටියේ. පුතා ඇවිල්ල බුදුආච්චි නංගී මූඩියක් කටේ දාගෙන කියලා කෑ ගැහුවා. මම දුවගෙන ඇවිත් දරුවා මුණින් අතට අල්ලා ගෙන මූඩිය ගන්න උත්සහ කළත් බැරිවුණා. ළමයගේ ඇස් වැහිලා ලේයි සෙමයි ගලන්න ගත්තා. විනාඩි පහක් යන්න කලින් ළමය ඉස්පිරිතාලෙට ගෙන ගියත් ඒ වනවිටත් මගේ රත්තරං කෙල්ල නැති වෙලා. ගෙදර තිබුණු වේදනා නාශක ආලේපන කුප්පියක මූඩියක් ළමයාගේඋගරේ හිරවෙලයි තිබුනේ යැයි වේදනා නාශක කුප්පියක මූඩියක් උගුරේ සිරවී මිය ගිය වයස අවුරුද්දයි දින 15 ක් වයසැති අකුරැස්ස ප්‍රදේශයේ නෙහෙන්සා සේනාධීර දැරියගේ මිත්තනිය වූ මාලනී (54) මහත්මිය හඬා වැලපෙමින් සඳහන් කළාය.

මෙම දැරිය සිය දෙමාපියන්,මුත්තණුවන් හා මිත්තණිය සමගින් මෙම නිවසේ ජීවත්ව සිට ඇත. දැරියගේ පියා පෙදරේරුවෙකු වන අතර මව ගෘහනියකි. මුත්තණුවන්,හා මිත්තණිය නිවස ආසන්න තේ වත්තක දළු නෙලීම හා කුලීවැඩවල නිරත වී සිටිති.දැරිය බලා කියා ගන්නේ දැරියගේ මව සහ මිත්තණිය විසිනි. පවුලේ සියලු දෙනාගේ ආදරය හා රැකවරණය මත හැදී වැඩුණු මේ දැරියගේ ජීවිත ගමන කෙලවර වූයේ නොසැලකිලිමත් ලෙස දැරියට ගත හැකි ස්ථානයක තබා තිබූ එම වේදනා නාශක කුප්පිය නිසාවෙනි.

පෙරේද සවස දැරියගේ පියාද නිවසේ සිටි අතර මව මුළුතැන්ගෙයි වැඩ කටයුතුවල නිරතව සිට ඇත. දැරියගේ මිත්තණිය නිවසට යාබද තේ වත්තේ තේ දළු නෙලීමට ගොස් සිටි අතර මිය ගිය දැරිය හා වැඩිමහල් සොහොයුරා වෙත ඔවුනගේ අවධානය යොමු වී නොමැත.

දැරිය මූඩිය මුවට දමාගෙන ඇත්තේ එම අවස්ථාවේය. ඒ විගසම වැඩිමහල් සොහොයුරා දැක එය මුඛයෙන් ඉවත් කිරීමට උත්සහ දරා ඇති මුත් එය උගුරේ සිරවී ඇත.දැරියගේ සොහොයුරා මේ ගැන නිවසේ මිදුලේ සිටි පියාට පවසා ඇත. පසුව ශබ්දය ඇසී දැරියගේ මවත්, මිත්තනියත් දිව විත් දැරියගේ උගුරේ සිරවූ මූඩිය ඉවත් කිරීමට ගත් උත්සහය ව්‍යාර්ථ වී තිබේ.

අනතුරුව දැරියගේ නාහයෙන් ලේ සහ සෙම පිටවී ඇති අතර දැරිය එකවරම සිහි මූර්ජා වට පත්වී ඇත. කඩිනමින් කඹුරුපිටිය රෝහල වෙත ගෙන ගියද දැරිය පරීක්ෂා කළ වෛද්‍යවරුන් පවසා ඇත්තේ ඇය මියගොස් ඇති බවය.

## නංගිගේ උගුරෙ හිරවුණු මූඩිය ගන්න හැදුවත් බැරි වුණා

### - සොයුරා

මියගිය දැරියගේ වැඩිමහල් සොහොයුරු කේ.ජී ඉදුවර සේනාධීර (07) මෙසේ පැවසීය.

මම නංගිව බලාගෙන ගේ ඇතුළට වෙලා හිටියේ. ගෙදර තිබුණ කුප්පියක් නංගී අතට අරගත්තා. නංගි එකපාරටම ඒකෙ මූඩිය ගිල්ලා. නංගිගේ උගුරේ ඒක හිරවුණා. මම ගන්න හැදුවත් බැරිවුණ නිසා අම්මටයි තාත්තටයි, ආච්චිටයි කතා කළා. එයාලටත් ගන්න බැරුව නංගිව ඉස්පිරිතාලෙට ගෙනිච්චා.

මෙම මරණය සම්බන්ධයෙන් පරීක්ෂණ අකුරැස්ස පොලිසිය විසින් සිදුකළ අතර දැරියගේ අවසන් කටයුතු ඊයේ (16 වැනිද) පවුලේ සුසාන භූමියේදී සිදු කරනු ලැබීය

■ ඒ.වන්නිආරච්චි - මාකඳුර

■ විජිත සල්ගාදු - අකුරැස්ස

කතුවැකිය

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 7.
දුරකතන : 0115 200 900
ෆැක්ස් : 0112 673 451
ඊ මේල් : aruna.editor@liberty.lk

කර්තෘමණ්ඩලය : 0115978982, 0115978985 ෆැක්ස් : 0112 673451
දැන්වීම් : 0112 672601, 0112 672603 ෆැක්ස් : 0112 672648
බෙදාහැරීම් : 0112 127204, 0112 127210 ෆැක්ස් : 0112 455134
වෙබ් : www.aruna.lk

Follows us on https://www.facebook.com/aruna.lk.official
Follow us on https://twitter.com/arunapuwath
Follow us on https://www.instagram.com/aruna.lk

# දුම්... ගැහිල්ල!

මෝටර් වාහනවලින් පිටවන දුමෙහි කාබන් ප්‍රතිශතය මැනීම සඳහා රටපුරා පිහිටුවා තිබෙන මධ්‍යස්ථාන හාරසිය හැටේම වායු විමෝචනය මනින යන්ත්‍ර නිසි ප්‍රමිතියෙන් තොර බව ඉකුත් සති අග අරුණ පුවත්පත මගින් රටට වාර්තා කර තිබිණි. එම පුවත මගින් හෙළිවන පරිදි වායු විමෝචනය සඳහා කිරුම් මිනුම් දෙපාර්තමේන්තුව නිසි ප්‍රමිතියකින් හා ක්‍රමවේදයකින් යුතුව මෙකී යන්ත්‍රවලට ඇතුළත් කළ ක්‍රමාංකනය කිරීමේ ක්‍රමවේදය වෙනුවට යන්ත්‍රවල සීල් කඩා අනිසි ක්‍රමාංකන වැඩසටහනක් ඇතුළත් කර තිබේ. මෙරට ධාවනය වන අසූඅට ලක්ෂයක් වන වාහනවලින් ලක්ෂ පනහකට අධික ප්‍රමාණයක් වායු විමෝචන සහතිකය ලබා ගත්තද වායු දූෂණයේ අඩුවක් නොමැති වීම පුදුමයට කරුණක් නොවන බව මෙම පුවතින් පැහැදිලි වන බව අමුතුවෙන් සඳහන් කළ යුතු නැත. සාමාන්‍යයෙන් බොහෝ දෙනා විශ්වාස කළේ වායු විමෝචන සහතිකය ඉතා වගකීමක් ඇතිව නිසි ක්‍රමවේදයන් අනුව නිකුත් කරන බවය. එහෙත් මෙරට අකාර්යක්ෂම සහ වංචා දූෂණයෙන් පිරුණු ජරාජීර්ණ වැඩපිළිවෙළින් වායු විමෝචන මධ්‍යස්ථානද මිදී නැති බව දැන් පැහැදිලිය. මෙකී වායු විමෝචන වැඩසටන ආරම්භ වූයේ 2008 සිටය. 2011දී වායු විමෝචන සහතිකය ලබා ගැනීම අනිවාර්ය කෙරිණි. පෞද්ගලික වාහන මෙකී සහතිකය ලබා ගැනීමට උනන්දුවක් දැක්වුවද රජයේ ලංගම බස් රථ ඇතුළු වාහන එහිලා එතරම් උනන්දුවක් නොදැක්වූ බව පෙනේ. කෙසේ වුවද මුදල් වියදම් කර වායු විමෝචන සහතික ලබා ගැනීම ගඟට ඉනි කැපීම වැනි වැඩක් යැයි එකී සහතික ගත් වාහන හිමියන්ට සිතුනොත් එය පුදුමයට කරුණක් නොවේ.

මෙකී විමෝචන සහතික නිකුත් කිරීමේ වැඩපිළිවෙළ පිළිබඳ ගැටලු මතු වූයේ අද ඊයේ නොවේ. දුම් සහතිකය ලබා ගත්තේ යැයි ප්‍රදර්ශනය කෙරෙන මගී ප්‍රවාහන බස් රථ ඇතුළු බොහෝ වාහන මාර්ගය දුම් වලාවකින් වසාගනිමින් ගමන් කරනවා දුටු මහජනතාවට එමගින් දුම් සහතිකයේ තරම කෙබඳු එකක් දැයි දැන ගැනීමට හැකි විය. සමහර වාහන දුම් සහතිකය ලබාගෙන පාරට වාහනය දමන්නේ මේ ආකාරයට දුම් වලාකුළක් නිර්මාණය කරමිනි. මෙම දුම් සහතික නිකුත් කිරීමේ කාර්ය නිල වශයෙන් පැවරෙනුයේ මධ්‍යම පරිසර අධිකාරියටය. එහෙත් එම අධිකාරියට වුවමනා කරන මානව සහ භෞතික සම්පත් ප්‍රමාණවත් නොවූ හෙයින් මෙකී වගකීම පෞද්ගලික සමාගම් දෙකකට පැවැරිණි. පෞද්ගලික අංශය හොඳට කරනවා යැයි උජාරුවන් සිතා සිටින අයට පෞද්ගලික අංශයේ කෙරුවාවද මෙකී වායු විමෝචන මධ්‍යස්ථානවලින් තේරුම් ගත හැකිය. මෙරට රාජ්‍ය අංශය තුළ පිළිකාවක් සේ පැතිර තිබෙන වංචා, දූෂණ, අල්ලස් යාන්ත්‍රණයෙන් පෞද්ගලික අංශයද මිදී නැති බව එයින් සක්සුදක් සේ පැහැදිලි වේ. මෙරට තිබෙන එකම යාන්ත්‍රණය මෙම වංචා දූෂණ අල්ලස් යාන්ත්‍රණයයි.

දුම් සහතික නිකුත් කිරීමට පියවර ගැනීම පරිසර හිතවාදී ජයග්‍රහණයකි. එසේම මහජනතාවගේ සෞඛ්‍ය පැත්තෙන් බලන විට එය විශිෂ්ට ජයග්‍රහණයකි. එහෙත් එකී ජයග්‍රහණ නාමික ජයග්‍රහණ බවට දැන් පත් වී තිබේ. 2012 සිට 2016 දක්වා සෞඛ්‍ය අංශ මගින් කෙරුණු සමීක්ෂණයකින් පැහැදිලි වූයේ මෙරට ශ්වසන රෝගීන් ගේ සහ ශ්වසන රෝග හේතුවෙන් මිය යන ප්‍රමාණයේ ඉහළ යෑමක් දැකිය හැකි බවය. මෙයට ප්‍රධානතම හේතුව මෝටර් වාහනවලින් නිකුත් කරන දූෂිත වායු වර්ගය. වායු විමෝචන සහතික නිකුත් කිරීමේ අරමුණ වූයේ මාර්ගයේ ධාවනය වන වාහන නිසි තඩත්තුවකින් යුක්තදැයි සොයා බලා මහජන සෞඛ්‍යයට හානි නොවන ආකාරයට එකී වාහනවල වායු විමෝචනය පවත්වා ගැනීමය. එහෙත් මෙකී සමීක්ෂණ වාර්තා මගින් පෙණෙන පරිදි වායු විමෝචන සහතික නිකුත් කිරීමෙන් නිසි ප්‍රතිඵල ලැබී නොමැත. එසේ ලැබී තිබේ නම් පෙරට වඩා ශ්වසන ආබාධවල අඩුවක් තිබිය යුතුය. මේ අතර ජාතික විගණන කාර්යාලයේ කාර්යසාධන විගණන අංශය මගින් වායු විමෝචන වැඩසටහනේ කාර්යක්ෂමතාව, ඵලදායිත්වය හා පාරිසරික බලපෑම ඇගයීම යනුවෙන් නිකුත් කළ වාර්තාවේ ද මෙම වායු විමෝචන වැඩසටහනේ තිබෙන ගැටලු තැන් දක්වා තිබේ. එම වැඩසටහනෙන් අපේක්ෂිත අරමුණු ඉටු නොවන බවට නිදසුන් රැසක් එහි දක්වා ඇත.

එහෙත් එවැනි වාර්තා සහ වෙනත් අධ්‍යයන මගින් කරුණු දැක්වුවද වායු විමෝචන සහතික නිකුත් කිරීමේ වැඩපිළිවෙළ නිසි පරිදි මෙහෙයැවීමට වගකිව යුතු සමාගම් සමත්කමක් දක්වා නොමැත. මේ රටේ විවිධ විසිතුරු නම් තිබෙන ආයතන රැසක් තිබේ. ඒ අතර රාජ්‍ය ආයතන විශේෂ තැනක් ගනී. මහජන මුදල් නාස්ති කරමින් ආයතන ස්ථාපිත කළද ඒවා පිළිබඳ නිසි පසු විපරමක් කෙරෙන්නේ නැත. වායු විමෝචන සහතික නිකුත් කිරීම දුම් ගැහිල්ලක් බවට පත්ව තිබෙන්නේ ඒ නිසාය. මෙම සහතිකය ලබා ගැනීමට මහජනතාව මුදල් වියදම් කරන්නේ පොකැට්ටුවෙන් ඉතිරිලා පැතිරිලා බිමට වැටෙන්න මුදල් හදල් තිබෙන නිසා නොවේ. එහෙත් එසේ සහතික ලබාගත් මහජනතාව වියදම් කළ මුදල්වලට සරිලන ප්‍රතිලාභයක් ඔවුනට ලැබී නොමැත. ජනාධිපතිවරයා ඇතුළු ආණ්ඩුව ගෝලීය දේශගුණ විපර්යාස අර්බුදය ගැන දැඩි උනන්දුවක් දක්වන බව පෙනේ. ඒ පිළිබඳ අධ්‍යයනය කිරීමට කලාපීය මට්ටමේ විශ්වවිද්‍යාලයක් ද මෙහි ස්ථාපිත කිරීමට නියමිතය. දේශගුණික විපර්යාසවල සමුළුවලටද ආණ්ඩුවේ නියෝජිතයෝ ඉතා උනන්දුවෙන් සහභාගි වෙති. එහෙත් රටේ වායු විමෝචන සහතික නිකුත් කිරීමේ යාන්ත්‍රණයට දුම් ගැහිලා තිබෙන බව තහවුරු වීමෙන් පෙනෙන්නේ මේ රටේ දැකිය හැක්කේ ලෝකෙට පරකාසේ, ගෙදරට මරගාතේ වැඩ පමණක් බවය.

# නීතිපතිතුමා මැදිහත්වෙලා කුරුන්දි නඩුව ඉක්මන් කළොත් ජාතීන් අතර ඇතිවෙන්න යන ගැටුමක් වළක්වාගන්න පුළුවන්



**මුලතිව් කුරුන්දි විහාරය වර්තමානයේ වඩාත් කතාබහට ලක්වන පුරාවිද්‍යා භූමියකි. පසුගිය සිකුරාදා කුරුන්දි විහාරයට අයත් පුරාවිද්‍යා භූමියේ පොංගල් බතක් සැකසීමට දෙමළ දේශපාලනඥයෙක් ප්‍රමුඛ පිරිසක් උත්සාහ ගැනීමක් නිසා යම් කලහකාරී තත්ත්වයක් ඇතිවුණි. මෙම පුදබිම නිසා නැවත සිංහල සහ දෙමළ ජනතාව අතර කෝලාහලයක් ඇතිවිය හැකි බවට ද ඇතැම්හු අනතුරු අඟවති. කුරුන්දි විහාරය නිසා සැබවින් ම සිදුවන්නේ කුමක් ද? මේ ඒ ගැන එම විහාරයේ විහාරාධිපති ගල්ගමුවේ සන්තබෝධි හිමියන් කියන දේය.**

**කුරින්දි විහාරය සම්බන්ධයෙන් කලහකාරී සිදුවීම් ගණනාවක් වුණා. පසුගිය සිකුරාදා දිනයෙදිත් එවැනි සිදුවීමක් වාර්තා වුණා. එතන දී අධිකරණයේ අවසරය ඇතිව පොංගල් වන්දනාවට ආපු දෙමළ ජනතාව, ඔබවහන්සේ ඇතුළු භික්ෂූන් වහන්සේ විසින් ආපහු හරවා යැවූ බවට පුවත් පළවෙනව. ඇත්තට ම එදා මොකක්ද වුණේ....?**

හිටපු පළාත් සභා මන්ත්‍රී රවිහරන් ඇතුළු කණ්ඩායමක් කුරුන්දි පුද බිමට ඇවිත් පොංගල් උත්සවයක් කරන්න සැලසුම් කරල තියෙන බව මම කලින් ම දැනගෙන හිටිය. ඒ නිසා ඒක වළක්වාගන්න අවශ්‍ය නීතිමය පියවර මම ඊට පෙර සිදුකළා. ඒත් උසාවියෙන් තීන්දුව ලැබුණෙ ආගමික නිදහසට හැමෝට ම අයිතියක් තියෙන බවත්, පුරාවිද්‍යා ආඥාපනත උල්ලංඝනය වන දෙයක් සිදුනොවිය යුතු බවට යි. හැබැයි එද ආපු පිරිස ඒ උසාවි නියෝගය නොතකා පුරාවිද්‍යා භූමියේ ගිනිමැල ගහන්න උත්සාහ කළා. ඒ විදිහට පුරාවිද්‍යා රක්ෂිතයක් ඇතුළෙ ගිනි දැල්වීම නීති විරෝධි යි.

අපි සත්බුදු වන්දනා පිංකමක් කරමින් සිටිද්දි තමයි මේ පිරිස එද ආවෙ. ඔවුන් ඇවිත් අපි කැනීම් කරන පිළිම ගෙයි ඉදිරිපිට ලොකු ගිනිමැලයක් ගහල පොංගල් බත උයන්න සැලසුම් කළා. ඒකට තමයි මම විරුද්ධ වුණෙ. පුරාවිද්‍යා නිලධාරියාත් ඒකට විරුද්ධ වුණා. මම කිව්ව පොංගල් බතක් පූජා කරන්න ඕන නම්, ඒක පුරාවිද්‍යා භූමියෙන් පිටත හදල, ඇවිත් පූජා කරන්න කියල. හැබැයි ඒකට ඔවුන් එකඟ වුණේ නෑ. ඔවුන් කිව්වෙ පුරාවිද්‍යා භූමියේ ම ගිනිමැල ගහල, එතන කිරිබත හදල පූජා කරන්න ඕන කියල. මම කිසිසේත් ම ඒකට ඉඩ දෙන්න කැමැති වුණේ නෑ. හැබැයි ඒකට මුලින් විරුද්ධ වුණු පුරාවිද්‍යා නිලධාරියත් පස්සෙ කිව්ව තහඩුවක් මත ගිනි දැල්වුවාට කමක් නෑ කියල.

**පුරාවිද්‍යා නිලධාරියෙක් කියන්නෙ හොඳින් පුරාවිද්‍යා නීතිය දන්න කෙනෙක්. ඔහු අවසර දුන්න නම් තහඩුවක් මත කිරිබත උයන්න, ඇයි ඔබවහන්සේ ඒකට විරුද්ධ වුණේ....?**

2018 කලින් කුරුන්දි විහාරය ගැන නඩු කටයුත්ත පටන් ගන්න කලින් මේ අය ඇවිත් කැලේ මැද්දෙ පූජාවක් තිබ්බ. ඒක ෆොටෝ ගහල චිරාත් කාලයක් මෙතන දේව වන්දනාවන් කළා කියල ඔවුන් දැන් පෙන්වනව. ඒක පට්ටපල් බොරුවක්. සිකුරාද පූජාව කරන්න දුන්න නම්, අත්ත මුත්ත කාලෙ ඉඳල කිරි ඉතිරුවා කියල හැමෝට ම පෙන්ව යි. අද දවසෙ එක ලිප යි. ඊට පස්සෙ ලිප් සීයක් පත්තු කර යි. ජේතවනෙ මේ වෙද්දි නයාරු ගුරුකන්දට කරන දේ. අද වෙද්දි ගුරුකන්දෙ ආවාස ගේ වටකරගෙන ලිප ගිනි මොලවනව.

කොහොමටත් මේ අය එන්නෙ ආගමික හැඟීමකින් නෙමෙයිනෙ. අනෙක පුරාවිද්‍යා ආඥා පනත අභිබවා යන්න කාටවත් බෑ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පැහැදිලිව දන්වල තියෙනව මේක බෞද්ධ ආරාම පද්ධතියක්. බෞද්ධයන් ගෙ හිත් රිදවන දේවල් මෙතන කරන්න දෙන්න බෑ කියල.

**පන්සල අවට ගම්මානයෙ ඉන්න දෙමළ ජනතාවයි, පන්සලයි අතර තියෙන්නෙ මොනවගේ සම්බන්ධයක් ද?**

ගම්මානයේ ඉන්න දෙමළ ජනතාවට පන්සලට එනව. කුරුන්දි විහාරයට එන දයකයන් මගෙන් ඉල්ලීම් කරනව ගමේ ඉන්න අහිංසක දෙමළ ජනතාවට මොනව හෝ දෙන්න අවශ්‍ය බව. ඒ වෙලාවට මම පණිඩ්ඩයක් යැව්ව ම ගමට, ට්‍රැක්ටරයක නැගල ඔවුන් පහළොවක්, විස්සක් පන්සලට එනව. ඇවිත් පන්සලේ වැඩවලට උදව් උපකාර කරල තෑගිත් අරගෙන යනව. ඇත්තට ම අපට බොහො ම හිතවත් දෙමළ පවුල් දෙක තුනක් ගමේ ඉන්නව. ඒ වගේ ම පන්සලේ උත්සවයක් තියෙද්දි පොල් අතු වගේ දේවල් පවා පන්සලට ගෙනල්ල දෙන්නෙ ගමේ ඉන්න දෙමළ ජනතාව. ඔවුන්ට කුරුන්දි විහාරය ගැන කිසි ම ගැටලුවක් නෑ.

**දෙමළ දේශපාලනඥයො කුරුන්දිය ඔවුන් ගෙ දේශපාලන ඕනෑ එපාකම්වලට පාවිච්චි කරනව වගේ, දකුණෙ ඇතැම් සිංහල දේශපාලනඥයොත් කුරුන්දි විහාරය දේශපාලන වාසි වෙනුවෙන් පාවිච්චි කරන බවට චෝදනා නැගෙනව. අපි දැක්ක පසුගිය සමයෙ කුරුන්දියට ආපු සිංහල දේශපාලනඥයන්ව...**

දකුණෙ දේශපාලන අධිකාරියට කුරුන්දිය ගැන උනන්දුව ඇතිවෙන්නෙ පාර හැදුවෙ උතුරෙ දේශපාලනඥයො. උතුරෙ දේශපාලනඥයො පාර්ලිමේන්තුවෙදි අමු පට්ටපල් බොරු කියනව මේ ස්ථානය ගැන. ඒකට උත්තර දෙන්න අපිට ක්‍රමයක් නෑ. එතකොට වෙන්නෙ කවුරුන් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ට කතා කරල, කුරුන්දිය සම්බන්ධයෙන් නිවැරැදි කිරීමක් පාර්ලිමේන්තුවෙදි කරන්න ඉල්ලීම් කරන්න. නැත්නම් වෙන්නෙ පාර්ලිමේන්තුව ඇතුළෙ දෙමළ දේශපාලනඥයො කියන දේ සමාජගතවීම. ඒ විතරක් නෙමෙයි, ඒ ප්‍රකාශ හැන්සාඩ්ගතවෙනව. ඒ නිසා පාර්ලිමේන්තුවෙ ඉන්න පක්ෂ - විපක්ෂ බොහෝ දෙනෙක්ට මම කතා කළා හරි දේ පාර්ලිමේන්තුව ඇතුළෙ කතාකරවන්න. මම මෑතක ම දවසක ජනාධිපති ලේකම්තුමාටත් කිව්ව මට මෙතන තියෙන ප්‍රශ්න ටික නිරාකරණය කරල දුන්නොත් කිසි ම දේශපාලනඥයෙක් මේ පන්සල කරගෙන යන්න මට ඕන නෑ කියල. එහෙම වුණොත් මට පුළුවන් ජාතීන් දෙක අතර සමගිය ඇතිවෙන විදිහට මේ පන්සල පවත්වගෙන යන්න. හැබැයි ඒ කටයුත්තට බාධා කරන්නෙ ම උතුරෙ දේශපාලනඥයො.

**හැබැයි කුරුන්දිය මුල්කරගෙන ඔබවහන්සේ රටේ ජාතිවාදී ප්‍රශ්නයක් ඇතිකරන්න හදන බවට චෝදනා නැගෙනව නේ ද?**

මේ ස්ථානය ගැන කිසි ම දැනුමක් නැති අය එහෙම කියන බව මම දන්නව. සමහර දේශපාලනඥයො සෘජුව ම වෙනත් ආගම්වලට කත් අදින අය. ඒ අය ඔවුන් ගෙ ආගමික න්‍යාය පත්‍රය ඇතුළෙ අපිට චෝදනා කිරීම තමයි ලේසියෙන් ම කරන්නෙ. මම කියන්නෙත් ජාතිවාදී කලබලයක් ඇතිවෙන්න කලින් මේ ප්‍රශ්න නිරවුල් කරදෙන්න මෙතනට ඇවිත් බලන්න කියල. ජනාධිපති ලේකම් කාර්යාලයේ මහත්වරු ඇවිත් මෙතන බැලුව. හැබැයි තාමත් ප්‍රශ්නය එතන ම යි. ශ්‍රේෂ්ඨාධිකරණයේ කුරුන්දි පුදබිම සම්බන්ධයෙන් නඩුවක් තියෙනව, මෙතන හින්දු කෝවිලක් තිබුණ, පුරාවිද්‍යා භූමියක් කිරීම නිසා දැන් දෙමළ ජනතාවට ඒක වන්දනා කරන්න බෑ කියල. ජනාධිපති නීතිඥ පාර්ලිමේන්තු මන්ත්‍රී සුමන්තිරන් තමයි ඒ වෙනුවෙන් පෙනී ඉන්නෙ. ඒ නඩුව දල තියෙන්නෙ 2021 අගෝස්තු. දැන් ඒකට අවුරුද්දක් වෙන්න ඇවිත්. හැබැයි තාමත් තීන්දුවක් ලැබිල නෑ. ඒනිසා නීතිපතිතුමා මේ නඩුව ඉක්මන්කරවල, ඉක්මනින් තීන්දුවක් දෙන තැනට ගේනව නම්, ජාතීන් අතර ඇතිවෙන්න යන ගැටුමක් වළක්වන්න පුළුවන්.

**"කුරුන්දි විහාරය නිසා උතුරේ දෙමළ ජනතාවට වෙන සෙතේ මොකක් ද?" කියා අයන අයත් ඉන්නව....**


කබොක් ගල්වලින් නිමැවූ මෙතෙක් හමුවෙලා තියෙන ලොකු ආරාම පද්ධතිය තියෙන්නෙ කුරුන්දි පුදබිමේ. මෙතන පන්සලක් විතරක් නෙමෙයි, ජනාවාස සංකීර්ණයක් තියෙනව. මෙතන විශාල යඩක නිස්සාරණය කරපු, ආභරණ හදපු වැඩබිමක්. බෙල් මහත්තය ගෙ වාර්තාවක තියෙනව මේ ස්ථානය අවට තිබුණු පරණ කුරුඳුගම ඔහු දැක්ක කියල. ඒ නිසා මෙතන ලෝක උරුමයක් බවට පත්කරන්න තරම් වුණු වටිනාකමක් ගැබ්වෙලා තියෙනව.

ඉතින් ඒ පෞඪත්වයක් එක්ක මෙතැන ගොඩනැගුණොත් වාසිය තියෙන්නෙ සිංහල ජනතාවට නෙමෙයි, ප්‍රදේශය අවට ඉන්න දෙමළ ජනතාවට. බලන්න සේරුවිල නිසා අවට ප්‍රදේශවල මුස්ලිම් ජනතාව කොච්චර ආදයම් ලබනව ද කියල ඒක වඳින්න යන බැතිමතුන් ගෙන්. මෙතන තියෙනව කබොක් ගලින් හදපු ලොකු ම චෛත්‍යය. කුරුන්දි විහාරය දේශීය විතරක් නෙමෙයි විදේශීය සංචාරකයින් පවා ආකර්ෂණය කරගන්න පුළුවන් තැනක්. එහෙම ආවොත් ඒක අවට ප්‍රදේශවල ඉන්න ජනතාවට ආර්ථික වශයෙන් වාසිසහගත යි. කෙටියෙන් ම කියනව නම් කුරුන්දිය කියන්නෙ ප්‍රදේශය සංවර්ධනයට සෘජුව ම බලපාන පුදබිමක්. අපි දැක්ක මේ ටික කාලයට කුරුන්දිය වන්දනා කරන්න ආපු පිරිස මේ අවට හෝටල්වල කොච්චර නතරවෙලා හිටියද කියල. නැදුන්කනී නගරයෙන් කොච්චර දේවල් ඒ එන මිනිස්සු ගන්නවද කියල. මුලතිව් නගරයෙන් මේ එන පිරිස කොච්චර දේවල් ගන්නව ද? ඔය එන පිරිස දස දහසින් වැඩිවුණොත් ඒ ප්‍රතිලාභ කොච්චර නම් ඒ ජනතාවට ලැබෙනවද කියල අමුතුවෙන් කියන්න ඕන නෑනෙ.

**පුරාවිද්‍යා ස්ථාන වාර්ගික උරුමයක් විදිහට නෙමෙයි, පොදු මානව උරුමයක් විදිහට සලකා කටයුතු කරනවා නම් ජාතීන් අතර අර්බුද ඇතිවෙන්නෙ නෑ කියල මහාචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි පසුගිය දිනක අදහස් දක්වල තිබුණ. මේ අදහස ගැන ඔබවහන්සේ ගේ ආකල්පය මොකක් ද?**

දැනටමත් පුරාවිද්‍යා ස්ථාන පොදු මානව උරුමයක් විදිහට සිංහල බෞද්ධ ජනතාව පිළිගන්නවනෙ. අපි කවදාවත් පොළොන්නරුවෙ තියෙන ශිව දේවාලය කඩන්න කියනව ද? අපි නල්ලූර්වල ගිහින් සත්බුදු වන්දනා තියෙනව ද? ඇයි දෙමළ දේශපාලනඥයන්ට, දෙමළ අන්තවාදීන්ට බැරි උතුරෙ තියෙන බෞද්ධ උරුමය පිළිගන්න. එතකොට කවු ද මේව වාර්ගික විදිහට අරගෙන ජාතිවාදී ගැටුමකට අරගෙන යන්නෙ....? බෙදුම්වාදී න්‍යාය පත්‍රයකට අනුව කටයුතු කරන පිරිස තමයි මේ සියල්ල කරන්නෙ. සාමාන්‍ය දෙමළ ජනතාවට එහෙම ප්‍රශ්නයක් නෑ.

■ සංවාදය - ලක්මාල් බෝගහවත්ත




## ගපිරිගේ කවිය

### බාල ඖෂධ සහ මරණ...

තත්වෙන් බාල ඖෂධ එන්නත් කරලා
සිදුවුණු මරණ ගැන දුක හිතෙනව අහලා
මේ අපරාදෙ පිළිබඳ පුවතුත් බලලා
අපෙ ගරු ඇමැති සඳ සුවසේ ඇත නිදලා

ඇමැතිගෙ කාර්යාලය අසලට යන්ට
අවසර ඇත්තෙ ජාවාරම් කරුවන්ට
පවසයි ජවිපෙ දෙස්තර රට වැසියන්ට
ජනපතිතුමාටත් එක්ක ම දැනගන්ට

## මහනුවර සහ පේරාදෙණියේදී
# ආන්දෝලනාත්මක ප්‍රතිජීවක ඖෂධය තාවකාලිකව නවතී


සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන

■ කමල් සුරවීර - මහනුවර

උදරාබාධයක් හේතුවෙන් පේරාදෙණිය ශික්ෂණ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී මරණයට පත්වූ 21 හැවිරිදි තරුණියට ලබාදුන් සෙෆ්ට්‍රිඇක්සෝන් (Ceftriaxone) නමැති ඖෂධය මහනුවර සහ පේරාදෙණිය රෝහල්වල දී භාවිතය තාවකාලිකව නතර කළ බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන පැවසීය.

එම ප්‍රතිජීවක ඖෂධය ලබා දීමෙන් මහනුවර ජාතික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටි තවත් රෝගීන් දෙදෙනකුද අසාත්මිකතාවට පත්වීම නිසා මෙම පියවර ගත් බවද ඔහු කීවේය. අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ බව සඳහන් කළේ පේරාදෙණිය ශික්ෂණ රෝහල, පේරාදෙණිය සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහල හා මහනුවර ජාතික රෝහල නිරීක්ෂණය කර ඒවායේ අධ්‍යක්ෂවරු, පරිපාලන නිලධාරින් හා විශේෂඥ වෛද්‍යවරු සමග සාකච්ඡාවක් පැවැත්වීම සඳහා පෙරේද (15 වැනිදා) පැමිණි අවස්ථාවේදීය.

මෙම රෝහල් දෙකට නිකුත් කර තිබෙන එම ඖෂධ කාණ්ඩ පරීක්ෂාව සඳහා වෛද්‍ය රසායනාගාරය වෙත යැවීමට පියවර ගන්නා බවත් ඒ වෙනුවට වෙනත් කාණ්ඩවලට අයත් එම ඖෂධ මෙම රෝහල් දෙකට ලබාදෙන බවත් කී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙසේද කීවේය.

මෙම අවස්ථාවට නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරු වන ජී. විජේසූරිය, ඩී.ආර්.කේ. හේරත්, සුදත් ධර්මරත්න, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ප්‍රියන්ත අතපත්තු ඇතුළු පිරිසක් ද සහභාගී වූහ.

# අක්කර තුනක සතොස දේපළ විකුණන්න තීන්දුයි
## - සතොස වෘත්තිය සමිති

■ චාමර පල්ලේගෙදර

සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව (සතොස)ට අයත් ඉඩම් අක්කර තුනකට අධික ප්‍රමාණයක ඇති දේපළ සහ ඉඩම් විකුණා දැමීමට තීරණය කර ඇත.

සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ සභාපති පසඳ යාපා අබේවර්ධන විසින් වෙළෙඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කළ ලිපියක සඳහන් වන්නේ එම ඉඩම් සහ ගොඩනැගිලි දේපළ විකිණීමේ පදනම මත තක්සේරු කිරීමට තීරණය කර ඇති බවයි.

ඒ අනුව කොටදෙනියාව, මාරවිල, ඇඹිලිපිටිය, බලංගොඩ, කොළඹ, මාතර, මඩකලපුව, නුවරඑළිය සහ රත්මලාන යන ප්‍රදේශවල පිහිටි සතොස අලෙවිසල්, නිල නිවාස, නිවාඩු නිකේතන ඇතුළු ඉඩම් මෙලෙස විකිණීමට තීරණය කර තිබේ.

මෙම ඉඩම් සහ දේපළවල තක්සේරුව ලබා ගැනීමෙන් අනතුරුව තක්සේරු දෙපාර්තමේන්තුවට තක්සේරු ගාස්තු ගෙවීමට සතොසට මුදල් නොමැති බැවින් එය අමාත්‍යාංශය හරහා සිදු කර දෙන ලෙසද සංස්ථාවේ සභාපතිවරයා ඉල්ලා තිබේ.

කෙසේ වෙතත් සතොස වෘත්තිය සමිති නියෝජිතයන් පෙන්වා දෙන්නේ සතොස ප්‍රතිව්‍යුහගත කිරීමේ රජයේ වැඩපිළිවෙළ මගින් එහි සේවකයන් 300ගේ සහ සතොසට අනුබද්ධ ආරක්ෂක සේවා පොදු (පෞද්ගලික) සමාගමේ සේවක සේවිකාවන් 650ගේ රැකියා අහිමි වන බවයි.

මෙම තීරණ ගැනීමේදී විෂයභාර ඇමැති නලින් ප්‍රනාන්දු කිසිම අවස්ථාවක සේවකයන්ගේ හෝ වෘත්තිය සමිතිවල මත විමසුමක් සිදු නොකළ බවටද ඔවුහු චෝදනා කරති.

නිසි විගණනයක් කළහොත් සත්‍ය වශයෙන්ම වසා දැමීමට සිදු වන්නේ සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව (සතොස) නොව 'ලංකා සතොස' බවද වෘත්තිය සමිති නියෝජිතයෝ පවසති.

ලංකා සතොස ආයතනයට සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවෙන් (සතොස) ලබා ගත් සහල් ඇතුළු භාණ්ඩ සඳහා රුපියල් කෝටි දෙසිය හැත්තෑවකට අධික මුදලක් ගෙවීමට තිබේ. ඒ අනුව ලංකා සතොස ආයතනය ලබාගත් භාණ්ඩ සඳහා ඉකුත් 2018 වසරේ සිට රුපියල් දෙසිය හැත්තෑ කෝටි හය ලක්ෂ අනූහතරදහස් එකසිය හතක (2,700,694,107) මුදලක් ගෙවීමට ඇතැයි සතොස වෘත්තිය සමිති නියෝජිතයෝ කියති.

එවැනි විශාල මුදලක් ගෙවීමට සිදු වන බැවින් ඒවා යට ගසා ගැනීමට මෙලෙස සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව (සතොස) පාඩු ලබන බවට සඳහන් කරමින් එහි පාලනාධිකාරිය මෙලෙස එම සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමට පියවර ගෙන ඇති බවටද ඔවුහු සඳහන් කරති.

එමනිසා සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව (සතොස) පාඩු ලබන තත්ත්වයට පත් කර ඇත්තේ ලංකා සතොස ආයතනය මිසක් සතොස සේවකයන් නොවන බවද ඔවුහු අවධාරණය කරති.

## පාරිභෝගිකයන් 93%ක්
# ජල මණ්ඩලයට පොලු තියලා

■ සුනිල් රූපසිංහ - පල්ලේපොල



පාරිභෝගිකයන්ගෙන් සියයට අනූ තුනක් බිල්පත් ගෙවීම පැහැර හැරීමෙන් ජාතික ජල සම්පත් හා ජලාපවහන මණ්ඩලය මූල්‍ය අර්බුදයකට මුහුණපා ඇතැයි එම මණ්ඩලය පවසයි.

මේ වනවිට ජල බිල්පත් හිඟය රුපියල් කෝටි අටසිය දහතුන ඉක්මවන අතර, ජල බිල්පත් නොගෙවූ පාරිභෝගිකයන්ගේ ජල සැපයුම් විසන්ධි කිරීමට සහ ඔවුනට එරෙහිව නීතිමය පියවර ගැනීමට මණ්ඩලය තීරණය කර තිබේ. පාරිභෝගිකයන්ට ජල බිල්පත් හිඟය පිළිබඳව කෙටි පණිවිඩ මගින් දැනුවත් කර ඇති බවත් අවසන් නිවේදන, රතු නිවේදන නිකුත් කළ බවත් මණ්ඩලය සඳහන් කළේය.

## කෝටි ගණන් වංචා කළැයි
# සමාගම් හිමිකාරිණියක අත්අඩංගුවට

■ එෆ්. අස්ලම්

පෞද්ගලික ඉදිකිරීම් කොන්ත්‍රාත් සමාගමක් පවත්වාගෙන යමින් විවිධ පුද්ගලයන්ගෙන් රුපියල් කෝටි ගණනක මුදල් ලබාගෙන කොන්ත්‍රාත් නිම කර නොදුන් කාන්තාවක කොළඹ අපරාධ කොට්ඨාසය විසින් පෙරේද (15 වැනිදා) අත්අඩංගුවට ගෙන තිබේ.

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ කොලොන්නාව, ගැමුණු මාවතේ පදිංචි 35 හැවිරිදි කාන්තාවකි.

සැකකාරිය අංගොඩ, හිඹුටාන ප්‍රදේශයේ පෞද්ගලික ඉදිකිරීම් සමාගමක් පවත්වාගෙන ගොස් ඇති අතර, ඇය හැර වෙනත් කිසිවකු එහි කාර්ය මණ්ඩලයේ නොමැති බව කොළඹ අපරාධ කොට්ඨාසය සඳහන් කරයි.

ඇය දෙමටගොඩ ප්‍රදේශයේ කාන්තාවකට නිවසක් ඉදිකර දීම සඳහා රුපියල් ලක්ෂ අසූවක කොන්ත්‍රාත්තුවක් ලබාගෙන නිවසේ ඉදිකිරීම් නිසි ලෙස අවසන් නොකර රුපියල් ලක්ෂ පනස් හතක් වංචා කිරීමකට අදාළව කොළඹ අපරාධ කොට්ඨාසය වෙත ඇය සම්බන්ධයෙන් පැමිණිල්ලක් ලැබී තිබිණි.

ඊට අදාළව සැකකාර කාන්තාවට අවස්ථා කිහිපයකදීම අපරාධ කොට්ඨාසය හමුවට පැමිණෙන්නැයි දැනුම් දී තිබුණද, ඇය පොලිසිය මග හැර තැනින් තැන සැඟව සිට ඇත. ඇය මෙවැනිම ආකාරයෙන් තවත් බොහෝ දෙනකුට රුපියල් කෝටි ගණනින් මුදල් වංචා කර තිබෙන බව හෙළිවී තිබේ.

කොළඹ අපරාධ කොට්ඨාසයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇනසලම් ද සිල්වා, උප පොලිස් පරීක්ෂක රත්නකුමාර ඇතුළු පිරිසක් සැකකාරිය අත්අඩංගුවට ගත්හ.

# නීති විරෝධී සිද්ධියකට පාස්ටර් කොටු

■ බිමල් ජයසිංහ - බණ්ඩාරගම

අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ ලියාපදිංචි නොකර, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කරන මධ්‍යස්ථානයක් නීති විරෝධී ලෙස පවත්වාගෙන ගිය ආගමික සංවිධානයක පාස්ටර්වරයකු ඇතුළු දෙදෙනකු දෙහිවල පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

දෙහිවල, මල්වත්ත පාරේ මෙම මධ්‍යස්ථානය පවත්වාගෙන ගොස් තිබූ අතර, එහි පුනරුත්ථාපනය වෙමින් සිටි විවිධ ප්‍රදේශවල පදිංචි පුද්ගලයන් 34දෙනකු ආරක්ෂාව සඳහා පොලිස් භාරයට ගෙන තිබේ. පුනරුත්ථාපනය වන පුද්ගලයකුගෙන් මාසිකව රුපියල් තිස් දහසක් සහ ඖෂධ සඳහා රුපියල් පන්දහසක් අය කර ඇති අතර, ඔවුන් වෙනුවෙන් එම ස්ථානයේ තිබී ඇත්තේ අවම පහසුකම් බව ද පොලිසිය පැවසීය.


දෙමෝදරදී පෙරළුණු බසය

# මගී ජීවිත තුට්ටුවට දා වෙට්ටු දාන බස් කම්බස් වෙන හැටි

■ එෆ්. අස්ලම්
■ නුවන් ආරියවංශ - ඇල්ල
■ ටී. අසෝක් කුමාර් - හාලිඇල
■ සමන් පාලිත නානායක්කාර - හල්දුම්මුල්ල

අප බසයකට ගොඩවී ගම්බිම් බලා යන්නේ එහි රියදුරු කෙරෙහි විශ්වාස තබාය. එනමුත් ඇතැම් බස් රියැදුරන්ගේ නොසැලකිලිමත් රිය ධාවනය සහ මත්ද්‍රව්‍ය භාවිතා කර රිය පැදවීම ආදිය හේතුවෙන් දෛනිකව අහිමිවන මිනිස් ජීවිත ගණන ද ක්‍රමයෙන් ඉහළ යමින් පවතින බව රූපවාහිනි හා පත්තර වැනි දෑ බලද්දී අපට පෙනී යයි.

මගීන් 14 දෙනකුට දිවි අහිමි කළ පස්සර බස් අනතුර සහ පසුගිය සතියේදී මනම්පිටිය, කොටලීය පාලමෙන් පෙරළී මගීන් 11 දෙනකු බිලිගත් බස් අනතුර අපට සිහිපත් කරන්නේ මෑතකාලයේ සිදුවූ එවැනි මහා ඛේදවාචකවල දිග පළලය. එම අම්හිරි මතක අමතක කරන්නටවත් කාලයක් ඉතිරි නොකර පෙරේද (15 වැනිදා) උදෑසන තවත් බස් අනතුරක් සිදුව තිබුණේ හාලිඇල, දෙමෝදර ප්‍රදේශයේදීය.

බදුල්ල පළාත් මහ රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය ගයාන් කුරේ සඳහන් කළේ තුවාලකරුවන් 18 දෙනෙකු බදුල්ල රෝහලට ඇතුළත් කළ නමුත්, බරපතළ තත්ත්වයේ පසුවන කිසිවෙකු එහි නොමැති බවයි. තවද තුවාලකරුවන් කිහිපදෙනකු අත් හා අස්ථි බිඳීම් හේතුවෙන් රෝහල්ගතව ප්‍රතිකාර ලබන බවද ඒ මහතා කීවේය.

බදුල්ලේ සිට කොළඹ බලා ධාවනය වූ බසයක් දෙමෝදර ජල පොම්පාගාරය අසලදී වේගය පාලනය කර ගත නොහැකිව අඩි තිස් පහක් පමණ ගැඹුරු ප්‍රපාතයක පිහිටි නිවෙසක් සහිත ඉඩමකට පෙරළී ගියේ පෙරේද (15 වැනිදා) පෙරවරු 10.20ට පමණය. මෙම අනතුරට මුහුණ පෑ පෞද්ගලික මගී ප්‍රවාහන බසය මාර්ගයේ දකුණු පසින් ධාවනය කරද්දදී, ඊට ප්‍රතිවිරුද්ධ දෙසින් නිවැරැදි මංතීරුවේ පැමිණි වාහනයකට ඉඩදීමට යාමේදී බසයේ වේගය පාලනය කරගත නොහැකිව ප්‍රපාතයට ඇදී පෙරළී යන ආකාරය ආරක්ෂක කැමරා දර්ශනවලින්ද මනාව දැකගත හැකිව තිබේ.

බණ්ඩාරවෙල - බදුල්ල මාර්ගයේ පෞද්ගලික වාහනවලින් ගමන් ගත් පුද්ගලයින්ගේ හා ප්‍රදේශවාසීන්ගේ සහායෙන් එම අනතුරින් තුවාල ලැබූවන් දෙමෝදර රෝහල වෙත කඩිනමින් ගෙන ගොස් තිබේ. පසුව ගිලන් රථවලින් එම රෝගීන් බදුල්ල පළාත් මහ රෝහල වෙත මාරු කර යවා ඇත. මෙම අනතුරින් 21 දෙනකුට තුවාල සිදුව තිබූ අතර, රෝහල්ගතකර තිබූ පිරිසෙන් නව දෙනකු කාන්තාවන්ය.

මෙම අනතුර සම්බන්ධයෙන් ඇල්ල පොලිසිය විමර්ශන සිදුකළ අතර, රියදුරුගේ අපරීක්ෂාකාරී හා නොසැලකිලිමත් ධාවනය ඊට මූලික හේතුව බව අනාවරණය වී ඇත. මේ වනවිට එම රියදුරු බදුල්ල පළාත් මහ රෝහලේ ප්‍රතිකාර ලබන බවත් ඔහු අත්අඩංගුවට ගන්නා බවත් ඇල්ල පොලිසියේ ප්‍රකාශකයෙක් සඳහන් කළේය. මෙම අනතුර සැලවීමත් සමග බදුල්ල පළාත් මහ රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකයේ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී පාලිත රාජපක්ෂ, වෛද්‍ය චින්තක සමරජීව ඇතුළු වෙද හා හෙද කණ්ඩායම් තුවාලකරුවන්ට කඩිනමින් මූලික ප්‍රතිකාර සිදුකිරීමට සූදානමව සිටියහ. බදුල්ල පළාත් මහ රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය ගයාන් කුරේද අදාළ කටයුතු සම්බන්ධීකරණ සඳහා දයක විය.

බදුල්ල පළාත් මහ රෝහලේ වෛද්‍ය හා හෙද කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සමන්විත කණ්ඩායමක් ද අනතුර සිදුවූ ස්ථානයට පිටව ගියේ මිනිත්තු විස්සක පමණ කාලයකිනි. හදිසි අනතුරක් සිදු වූ ස්ථානයට මෙසේ වෛද්‍යවරුන් ඇතුළු රෝහල් කාර්ය මණ්ඩලයේ පිරිසක් පැමිණීම බොහෝදෙනකුගේ පැසසුමට ලක්විය.

මෙවන් අනතුරු සම්බන්ධයෙන් සෘජුවම චෝදනා එල්ල වන්නේ බස් රියදුරන්ටය. කෙසේ වෙතත් ජාතික ගමනාගමන කොමිෂන් සභාව සඳහන් කරන්නේ පෞද්ගලික බස් රියදුරන් අනුමත කාලයට වඩා අඩු කාලයකින් වැඩි වේගයෙන් බස් ධාවනය කිරීම නිසා මෙවැනි අනතුරු සිදුවන බවයි. දෙමෝදර අනතුර බැලූ බැල්මට රියදුරුගේ අපරීක්ෂාකාරී ධාවනය හේතුවෙන් සිදුවූවක් බව හෙළිවන බවත් එමනිසා මෙම බසයේ මාර්ග බලපත්‍රය අවලංගු කරන බවත් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපති ශෂි වෙල්ගම පැවසීය. බස් රියදුරන් හා කොන්දොස්තරවරුන් මගීන් ප්‍රවාහනය ගැන දැනුවත් කිරීමේ වැඩමුළු වලට යොමුකර බලපත්‍ර දෙන නමුත්, ඔවුන්ගේ වගකීම් විරහිත ක්‍රියාකලාපයන් නිසා මෙවැනි අනතුරු සුලභව වාර්තා වන බවද සභාපතිවරයා කීවේය.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් (කාර්මික) සුජීව තෙන්නකෝන්ගෙන් ද අපි මේ පිළිබඳ විමසුවෙමු.

"මේ බස්වලට පාරේ මගීන් අරන් යන්න පුළුවන් උපරිම වේගය පැයට කිලෝමීටර් 60යි. සැහැල්ලු වාහනයක් පදින්න පුළුවන් උපරිම වේගය පැයට කිලෝමීටර් 70 යි. ඒත් බස් රියදුරන් මගීන් ද පටවාගෙන මාර්ග නීති අමු අමුවේ උල්ලංඝනය කරමින් අධික වේගයෙන් ධාවනය කරනවා. මේ රියදුරන්ට අධික වේගය යටතේ නඩු පැවරීමට පොලිසියට පුළුවන්. ඒ වගේම දිගින් දිගටම අපරීක්ෂාකාරී බස් ධාවනය සම්බන්ධයෙන් පොලිසිය දැඩිව නීතිය ක්‍රියාත්මක කරන්නේ නම් බස් අනතුරුවලින් සියයට හැත්තෑ පහක්ම සිදුනොවීමේ ප්‍රවණතාවක් තියෙනවා. එවැනි වැරැදි කරන රියදුරන්ගේ රියදුරු බලපත්‍රය යම් කාලයකට අවලංගු කරන්නේ නම් සුපරීක්ෂාකාරී බස් ධාවනයක් බලා ගන්න පුළුවන්"

## අපරීක්ෂාකාරී ධාවනයට නීතිය ක්‍රියාත්මක කළොත් බස් අනතුරුවලින් 75%ක් වළකිනවා
### - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තුමේන්තුවේ සහකාර කොමසාරිස් (කාර්මික)


බසය පෙරළුණු අයුරු...

## දෙමෝදර අනතුර සිදු කළ බසයේ මාර්ග බලපත්‍රය අවලංගු කරනවා
### - ගමනාගමන කොමිසමේ සභාපති

# ග්‍රහචාරය

2023 ජූලි 17
වැනිදා සඳුදා

රාහු කාලය
උදේ 7.35 - උදේ 9.09
රාත්‍රී 7.57 - රාත්‍රී 9.24

ශුභ දිශාව බස්නාහිර
මරු - වයඹ

### මේෂ
**රැකියාවේ වාසි**

පොදු කටයුතුවලදී තරගකාරී හැඟීම් තවදුරටත් පවතිනු ඇත. ඉක්මන් හා දැඩි මානසික ස්වභාවයන් පාලනය කරගන්න. අදහස් වරින්වර වෙනස් කරන සුළු වේ. රැකියාවේ වාසි ඇතත් ලැබීම්වල අපිළිවෙළක් පෙනේ.

### වෘෂභ
**පාඩු සිදුවේ**

සාමාන්‍ය කතාව තරමක් සුහද බවක් ඇතිවේ. එහෙත් සියුම් තරගකාරී හැඟීමකින් යුක්තවේ. මිල මුදල් පරිහරණය ගැන සැලකිලිමත් විය යුතු වේ. නොදැනුවත්කම හෝ අත්වැරදීමකින් පාඩු සිදුවිය හැකිවේ.

### මිථුන
**ආගමික අදහස්**

කතා බස් විලාශයේ දැඩි බවක් ඇති කරනු ඇත. එහෙත් අදහස් දැඩි නොවේ. මිල මුදලින් ලැබීම් බොහෝ දුරට වාසි ගෙන දෙනු ඇත. ආගමික අදහස් ඇතද වරින්වර වෙනස් වන සුළු වේ.

### කටක
**හිතේ දැඩි ගතිය**

සිතිවිලි අදහස් ප්‍රවේශමෙන් ක්‍රියාත්මක කළ යුතු වේ. පාඩු සහගත තත්ත්වයන් ඇතිවීමට පුළුවන. හිතේ දැඩි අදහස් විශේෂයෙන් පාලනය කරගන්න. වාණිජ හෝ වෙළෙඳ ව්‍යාපාර කටයුතුවලදී අවිවේකයක් ඇතද පාඩුවක් නොදැනේ.

### සිංහ
**උරුමගත වාසි**

අදහස් හා ක්‍රියාකාරකම් වේගවත් වුවද ලැබීම්වලට අපහසු නොවේ. ජල හා ද්‍රව සම්බන්ධ ක්ෂේත්‍රවල වැඩ කරන අයට විශේෂයි. උරුමගත වාසි අත්වීමකටද ඉඩ තිබේ. ආගමික අංශවල යෙදීම පහසුකම් අත්කර දෙනු ඇත.

### කන්‍යා
**අහඹු වාසි**

බාධක ඇතද පාලනය කරගැනීමට හැකියාව ලැබෙනු ඇත. ලිපි ගනුදෙනුවලින් පාඩු ඇති නොවේ. විරුද්ධවාදීන්ගෙන් වුව අහඹු වාසි ලැබීමකට ඉඩ තිබේ. කතාව බොහෝ දුරට පාලනය වනු ඇත.

### තුලා
**නිහඬ බවක්**

හැසිරීම් රටාව බොහෝ දුරට නිහඬ බවක් ඇතිවේ. එහෙත් ක්‍රියාකාරකම්වල යහපත් ප්‍රතිඵල සුළු වශයෙන් හෝ අත්කර ගත හැකිවේ. සාධාරණ හෝ සංවර අදහස්වලින් අන්‍යයන්ගේ සිත් දිනා ගැනීමට හැකිවේ.

### වෘශ්චික
**ගමන්වලින් වාසි**

රැකියා කටයුතුවලදී ඉක්මන් හෝ ක්‍රියාශීලී ස්වභාවයක් ඇතද සිතේ සංකීර්ණ හා හැඟීම්බර වේ. ජලය හා සම්බන්ධ ක්ෂේත්‍රවල වැඩ කරන අය ප්‍රවේසම් වන්න. විවෘත ජලාශ පිහිනුම් තටාක ක්ෂේත්‍රයන් විශේෂයි. දුර බැහැර ගමන් වාසි ගෙන දෙනු ඇත.

### ධනු
**අන්‍යෝන්‍ය සබඳතා**

තම අන්‍යන්‍යතාවන් තව දුරටත් සමබරව පාලනය කරගැනීමට හැකි වේ. අන්‍යෝන්‍ය සබඳතා ඉතා සුහදව පවත්වා ගැනීමට හැකිවේ. පොත් ප්‍රකාශන සම්බන්ධ කටයුතු එතරම් වාසි නොපෙන්වයි. අත්‍යවශ්‍ය ගිවිසුම්වලට බාධා ඇතිවේ.

### මකර
**කතාබහට අසුබයි**

එදිනෙද කතා බහ සාමාන්‍යයෙන් ස්ථාවරවම පැවතීම ශුභ නොවේ. අවස්ථානුකූලව නම්‍යශීලී කරගන්න. උසස් අදහස් ඇති විය හැකි අතර අන්‍යයන් හා බෙද හද ගැනීමට හැකියාව මඳ විය හැකිය.

### කුම්භ
**පොදු පිළිගැනීමක්**

එදිනෙද කටයුතුවලදී නායකත්ව වගකීම් පැවරුණද එහි අවුල් තත්ත්වයන් පාලනය කර ගැනීමට උත්සාහ ගන්න. පොදු පිළිගැනීම ඉන් වඩාත් ස්ථාවර වනු ඇත. මිල මුදල් පරිහරණය තරමක් කරදර වනු ඇත.

### මීන
**හදිසි අනතුරු**

මිල මුදල් පරිහරණය බොහෝ දුරට යහපත් වේ. සිතේ නිරවුල් හා සැහැල්ලු බවක් ඇතිවේ. හදිසි අනතුරු තුවාල සම්බන්ධව වඩාත් ප්‍රවේසම් වන්න. රුධිර සීනි මට්ටම් පාලනයක් අවශ්‍ය වේ.



# න්නේ ලයේ ක් න්න ගැ

**- රාජ්‍ය ඇමැති ශාන්ත බණ්ඩාර**

ත් නිර්මාණය කිරීමට කර ඇති බව ද මෙමසන් වන විට තැපැලේ

එය සංශෝධනය කිරීමට පියවර ගනිමින් සිටින බවද එහි කටයුතු මේ වන විටත් සියයට අසූවකින්












# මහ කන්නයේදී ගොවීන්ට තවත් රසායනික පොහොරක් නොමිලේ



■ සාලිය කුමාර ගුණසේකර

ඉදිරි මහ කන්නයේ (2023-24) සිට තවත් රසායනික පොහොර වර්ගයක් ගොවීන්ට නොමිලේ ලබාදෙන බව කෘෂිකර්ම ඇමැති මහින්ද අමරවීර පැවසීය.

මෙවර යල කන්නයේදී ගොවීන්ට මඩ පොහොර හෙවත් ට්‍රිපල් සුපර් පොස්පේට් පොහොර නොමිලේ ලබා දීමට රජය කටයුතු කළේය.

ඒ අනුව, ඉදිරි මහ කන්නයේදී මඩ පොහොර හෝ මියුරියේට් ඔෆ් පොටෑෂ් පොහොර (එම්.ඕ.පී) ගොවීන්ට නොමිලේ ලබාදීමට කෘෂිකර්ම අමාත්‍යාංශය සැලසුම් කර ඇත. වී වගා කරන ලද ගොවීන්ට හෙක්ටෙයාර් එකකට රුපියල් 20,000 ක මුදලක් හා හෙක්ටයාර් දෙකකට රුපියල් 40,000ක මුදලක් ද වශයෙන් වවුචර්පත් මගින් නිකුත් කිරීමට රජය යල කන්නයේදී කටයුතු කළේය.

ලබන මහ කන්නයේ දී සියලුම ගොවීන්ට පොහොර මිල දී ගැනීම සඳහා වවුචර්පත් වෙනුවට ගොවි ජනතාවගේ ගිණුම්වලටම මුදල් නිකුත් කිරීමට නියමිතය. ඒ අනුව ගොවීන්ට සිය කැමැත්ත පරිදි පුද්ගලික අංශයෙන් හෝ රජයේ පොහොර සංස්ථා මගින් රසායනික පොහොර හෝ කාබනික පොහොර මිල දී ගැනීමට හැකිය.

යූරියා පොහොර මිටියක් රුපියල් 9000 ක් ද, මඩ පොහොර මිටියක් රුපියල් 14,000 දක්වාද අඩුකර ඇත.

## වවුචර්පත් වෙනුවට ගොවි ජනතාවගේ ගිණුම්වලටම මුදල්

# 50 හැවිරිදි කාන්තාවක දූෂණය කිරීමේ සිද්ධිය: විමර්ශන මෙහෙයවූ පොලිස් නිලධාරීන් අධිකරණයට

■ උපාලි ආනන්ද කරුණාදාස-අනුරාධපුරය

ආබාධිත හමුද කෝප්‍රල්වරුන් තිදෙනකු විසින් යුද හමුද සැරයන් මේජර්වරයකුගේ බිරිඳක මෙන්ම හමුද සෙබළුන් තිදෙනකුගේ මවකද වන 50 හැවිරිදි කාන්තාවක් රංචු ගැසී බරපතළ ලෙස දූෂණය කිරීමේ සිද්ධියට අදළව මහාධිකරණය හමුවේ පවතින නඩුවට සාක්ෂි ලබාදීම සඳහා ලබන සැප්තැම්බර් මස 12 වැනි දින අධිකරණය හමුවේ පෙනී සිටින ලෙස උතුරු මැද පළාත්බද මහාධිකරණ විනිසුරු විරාජ් රණතුංග මෙම සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශන මෙහෙයවූ හොරොව්පොතාන පොලිසියේ නිලධාරීන්ට නියෝග කළේය.

මෙම නඩුවේ විත්තිකාර හිටපු ආබාධිත හමුද කෝප්‍රල්වරුන් තිදෙනාටද එදින මහාධිකරණය හමුවේ පෙනී සිටින ලෙසටද විනිසුරුවරයා තවදුරටත් නියෝග කරනු ලැබීය. විත්තිකාර කෝප්‍රල්වරුන් තිදෙනාට වෙන් වෙන් වශයෙන් අධිචෝදනා හත බැගින් භාරදීමෙන් අනතුරුව තමන්ට එරෙහිව නගා ඇති සියලු අධි චෝදනාවන්ට නිවැරදිකරුවන් බව නීතිඥ කාලිංග රවින්ද්‍ර මගින් විත්තිකරුවන් මීට පෙර අධිකරණයට දැන්වීය.

2013 වසරේ ජූලි මස 23 වන දින හෝ ඊට ආසන්න දිනයක හොරොව්පොතානදී කාන්තාවක දූෂණය කර ඇය සතුව තිබූ රන් භාණ්ඩ මුදල් සහ ජංගම දුරකථන සොරකම් කිරීම ඇතුළුව අධිචෝදනා හතක් යටතේ මෙසේ අධිචෝදනා ලැබ සිටින්නේ මාතලේ මඩහපොල ස්ථිර ලිපිනයේ සහ හොරොව්පොතාන පරන්ගියාවාඩිය නබඩවැව තාවකාලික ලිපිනයේ පදිංචි කොලොන්නගේ ඒ. සුමිත් විජේරත්න, අනුරාධපුර විහාරපාලුම ලිපිනයේ ජී. ලලිත් ගුණසිංහ සහ කුරුණෑගල හිඳගොල්ල ලිඳපිටියවත්ත ලිපිනයේ ඩබ්. ඒ. උදය ශාන්ත ප්‍රේමදස යන හිටපු යුද හමුද ආබාධිත කෝප්‍රල්වරුන් තිදෙනෙකි.

විත්තිකාර හමුද කෝප්‍රල්වරුන් යුද හමුද සේවයේ නිරතව සිටියදී මෙම අපරාධය සිදු කළ බවට විමර්ශනවලදී හෙළිකර ගැනීමෙන් අනතුරුව යුද හමුදපතිවරයාගේ නියෝග මත ඔවුන් යුද හමුද සේවයන් නෙරපා හැර තිබිණි. මෙම නඩුවේ සිවු වැනි විත්තිකරු ලෙස නම් කර සිටි හිටපු යුද හමුද කෝප්‍රල්වරයකු වන බී.නිමලදස යන අය රජයේ සාක්ෂිකරුවකු ලෙස නම් කර සිටී. පැමිණිල්ල වෙනුවෙන් රජයේ අධිනීතිඥ ශක්ති ජාගොඩආරච්චි පෙනී සිටි අතර විත්තිකරුවන් වෙනුවෙන් නීතිඥ කාලිංග රවින්ද්‍ර පෙනී සිටියේය. මෙම නඩුවේ ලසු නොවන මූලික විභාගය කැබිතිගොල්ලෑව මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවැති අතර විත්තිකරුවන්ට අධිචෝදනා භාරදීමෙන් අනතුරුව වැඩිදුර විභාගය සඳහා අනුරාධපුර මහාධිකරණයට යොමු කර තිබිණි.

# ආගන්තුකයාගේ කේක් ගිලපු එකම පවුලේ පහක් සිහිසුන්ව රෝහලේ

■ ජූඩ් සමන්ත-පුත්තලම

■ මිහිසර රශ්වින්ද -මාරවිල

ආගන්තුකයකු විසින් ගෙනවිත් දී ඇති කේක් ආහාරයට ගෙන සිසිල් බීම පානය කළ එකම පවුලේ 05 දෙනෙකු ක්ලාන්තව රෝගී වීම හේතුවෙන් පුත්තලම මූලික රෝහලට ඇතුළත් කර ඇත.

15 වෙනිද සවස මෙම සිද්ධිය සිදුවී ඇත.

රෝහල් ගත කර ඇත්තේ පුත්තලම - සේනකුඩිරිප්පුව ප්‍රදේශයේ පදිංචි පිරිසකි. එම පිරිසට වයස අවුරුදු 65 සහ 86 වියේ පිරිමි පුද්ගලයින් දෙදෙනෙකුද,අවුරුදු 84,63 සහ 29 වියේ පසුවන කාන්තාවන් පිරිසක් අයත් වේ.

රෝහල් ගත කර ඇති 65 වියැති පුද්ගලයාට පසුගිය දිනක හෘද සැත්කමක් සිදු කර ඇත.ඔහුටඅයට මුල්‍ය අධාරයක් ලබා දීමට බව පවසමින් ආගන්තුකයින් නිවසට පැමිණ ඇති බව කියති.ආගන්තුකයින් නිවැසියන් සමග සුළු වේලාවක් කථා කරමින් සිට මුල්‍ය ආධාරය ලබා දීමට පෙර ඔවුන් විසින් ගෙනවිත් තිබූ කේක් සහ සිසිල් බීම ඔවුනට ලබා දී ඇත.එම කේක් ආහාරයට ගෙන සිසිල් බීම පානය කළ සෙසු පිරිස ක්ලාන්තව ඇද වැටනවා දැක ඇති 65 වියේ පසුවන අය මේ බව ක්ෂණිකව පුත්තලම නගරයේ පදිංචිව සිටින තම වැඩිමහල් දියණියට පවසා ඇත.අනතුරුව එම අයද ක්ලාන්තව නිවස තුළ වැටී ඇත.



දුකරතන ඇමතුම අනුව නිවසට පැමිණ ඇති වැඩිමහල් දියණිය දැක ඇත්තේ තම පියා,මව,නැගණිය,මුත්තා සහ මිත්තණිය ඔවුන්ගේ නිවස තුළ සිහිසුන්ව සිටිනා ආකාරයයි.ක්ෂණිකව ක්‍රියාත්මක වී ඇති ඇය රෝගී තත්ත්වයෙන් සිටි පිරිස රෝහල් ගත කිරීමට කටයුතු කර ඇත.

කේක් සහ සිසිල් බීම ගෙනවිත් ඇති අය ඒ සමගම අතුරුදහන්වී ඇති බව පොලීසිය කියයි.රෝහල් ගත කර සිටින අයගෙන් මෙතෙක් ප්‍රකාශයක් ලබා ගෙන නැත.ඔවුන්ගේ නිවසේ කිසියම් කොල්ලක් සිදුවී තිබේද යන්න අනාවරණය වී නොමැති බවද පොලීසිය කියයි.

පුත්තලම පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරයි.



# ඉඟුරු මිලත් සැරවෙයි

## කිලෝවක සිල්ලර මිල රු. 2400ක්

■ සාලිය කුමාර ගුණසේකර

ඉඟුරු කිලෝවක සිල්ලර මිල රුපියල් 2400 ක් දක්වා ඉහළ ගොස් තිබේ. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ ඉඟුරු තොග කිලෝවක් අලෙවි කෙරෙන්නේ රුපියල් 1100 ත් 1200 ත් අතර මිලකටය. සිල්ලර වෙළෙඳුන් ඉඟුරු වෙළෙඳමෙන් අධික ලාභයක් උපයන බව තොග වෙළෙන්දෝ කියා සිටිති. මේ දිනවල ඉඟුරු අස්වැන්න අඩුනිසා මිල ඉහළ ගොස් ඇතැයි වෙළෙන්දෝ පවසති.

### DLB සංවර්ධන ලොතරැයි මණ්ඩලය — www.dlb.lk — 2023.07.14 වන සිකුරාදා නිල ප්‍රතිඵල

| ලොතරැයිය | දිනය | දිනුම් වාරය | වර්ණය | ජයග්‍රාහී අංක | ඉංග්‍රීසි අක්ෂරය / ලකුණ | මිළඟ සුපිරි ජයමල්ල රු. |
|---|---|---|---|---|---|---|
| අද කෝටිපති | 2023.07.14 | 1975 | දම් | 19 30 36 60 | B | 57,428,462/- |
| අද කෝටිපති "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක | | | | 05 11 54 67 | I | |
| කප්රුක | 2023.07.14 | 1325 | දම් | S (17) 01 28 38 56 | | 416,751,064.20 |
| කප්රුක "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක | | | | 24 36 37 62 | I | |
| ලග්න වාසනාව | 2023.07.14 | 3861 | තද නිල් | 05 31 46 50 | මේෂ | 4,227,060/- |
| ලග්න වාසනාව "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක | | | | 37 43 54 62 | වෘෂභ | |
| සසිරි | 2023.07.14 | 349 | කොළ | 20 31 42 | අද බිහිවූ දෙලක්ෂපතියන් ගණන 10 | දිනා ඇති මුළු මුදල රු. 3,574,600/- |
| ශනිදා | 2023.07.14 | 4310 | තැඹිලි | 29 38 44 71 | U | 51,014,956.00 |
| ශනිදා "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක | | | | 28 48 49 50 | Q | |
| සුපර් බෝල් | 2023.07.14 | 2149 | රෝස | 28 60 62 67 | A | 55,173,292.40 |
| සුපර් බෝල් "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක | | | | 03 16 48 65 | M | |

### DLB සංවර්ධන ලොතරැයි මණ්ඩලය — www.dlb.lk — 2023.07.15 වන සෙනසුරාදා නිල ප්‍රතිඵල

| ලොතරැයිය | දිනය | දිනුම් වාරය | වර්ණය | ජයග්‍රාහී අංක | ඉංග්‍රීසි අක්ෂරය / ලකුණ | මිළඟ සුපිරි ජයමල්ල රු. |
|---|---|---|---|---|---|---|
| අද කෝටිපති | 2023.07.15 | 1976 | කහ | 11 15 58 65 | U | 57,674,646/- |
| අද කෝටිපති "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක | | | | 07 38 41 52 | Y | |
| කප්රුක | 2023.07.15 | 1326 | රතු | M (07) 11 12 16 49 | | 417,125,104.20 |
| කප්රුක "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක | | | | 17 42 43 64 | I | |
| ලග්න වාසනාව | 2023.07.15 | 3862 | ලා නිල් | 10 24 42 43 | සිංහ | 4,423,548/- |
| ලග්න වාසනාව "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක | | | | 02 03 13 38 | කන්‍යා | |
| සංවර්ධන වාසනාව | 2023.07.15 | 611 | තැඹිලි | 08 47 49 | T / දෛව අංකය 01 | 21,854,208.00 |
| ශනිදා | 2023.07.15 | 4311 | ලා කොළ | 04 33 67 72 | P | 51,125,272.00 |
| ශනිදා "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක | | | | 16 22 49 55 | Z | |
| සුපර් බෝල් | 2023.07.15 | 2150 | තද නිල් | 03 23 42 73 | K | 55,370,788.40 |
| සුපර් බෝල් "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක | | | | 13 55 62 66 | F | |

ජයග්‍රාහී ටිකට්පත් මාස 6ක් වලංගු වේ. * මේ වන විට සුපිරි ජයමල්ල දිනාගෙන ඇත්නම් එදිනට පවතින ජයමල්ල වලංගු වේ.






# The Wedding show




මංගල උත්සව සඳහා සේවය සපයන විවිධ වෘත්තිකයින් සහභාගී වූ ප්‍රදර්ශනයක් (The Wedding show 2023) 17 වැනි වරටත් කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ප්‍රදර්ශන මධ්‍යස්ථානයේදී පසුගිය 14,15 සහ 16 යන තෙදින පුරා පැවැත්වුණි. "අරුණ" පුවත්පත මුද්‍රිත මාධ්‍ය අනුග්‍රහය දැක්වූ එම ප්‍රදර්ශනයට සහභාගිවූ පිරිසකි මේ.

ඡායාරූප -
ලලිත් පෙරේරා
සමන් අබේසිරිවර්ධන




















ශිෂ්‍ය නායිකාවන්


මාධ්‍ය සංසදය


විදුහල්පතිනිය
එස්.එම්.ජී. ප්‍රියදර්ශනී

# කුඩාබුත්ගමුව ශ්‍රී රාජසිංහ ජාතික පාසල


ප්‍රථම ආදි ශිෂ්‍යයා
නාවලගේ බැනට් කුරේ

**කොටිකාවත්ත නාගහවෙල සුන්දර කඳුගැටයක් මත්තෙහි පිහිටා ඇති "තමා තමාට පහනක් වන්න" යන තේමා පාඨය පෙරදැරි කරගත් කුඩාබුත්ගමුව ශ්‍රී රාජසිංහ ජාතික පාසල අයත් වන්නේ ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ කොලොන්නාව කොට්ඨාසයටයි.**


ශිෂ්‍ය නායකයින්

1958 වර්ෂයේ තාවකාලික පොල්අතු මඩුවක සිසුන් එකොළොස් දෙනෙකුගෙන් යුක්ත පෞද්ගලික පාසලක් ලෙස මෙම පාසල ආරම්භ කරන්නේ ප්‍රදේශයේ සමාජ සේවකයකු වූ ඩී.ජී. කස්තුරිආරච්චි මහතා විසිනි. සෙනෙවිරත්නගේ ඌරුකොටුව නමින් හැඳින්වූ මෙම භූමිය එවකට අමාත්‍යවරයකු වූ පිලිප් ගුණවර්ධන විසින් රජයට පවරා ගන්නේ පාසලක් ඉදි කිරීම සඳහාය. අඹතලේ පහළ ගම්කාර්ය සභාවේ සභාපතිවරයා වූ කේ.ජී. පෙරේරාගේ යෝජනාවක් අනුව එවකට කොළොන්නාව මන්ත්‍රීවරයා වූ ඩී.එස්. සමරසිංහ විසින් 1962 දී පාසල් ගොඩනැගිල්ලක් සඳහා මුල්ගල් තබා ගොඩනැගූ පාසල 1963 වර්ෂයේදී සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ අතින් විවෘත කරනු ලැබීය.


ක්‍රිකට් කණ්ඩායම


බාලදක්ෂ කණ්ඩායම


අනධ්‍යයන කාර්ය මණ්ඩලය


විදුහලේ සිසුන්

ඒ ආකාරයෙන් අවට පාසල් කිහිපයකින් තෝරාගත් ප්‍රාථමික පන්ති සිසුන් පිරිසක් ඇතුළත් කරගෙන කුඩා බුත්ගමුව ශ්‍රී රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලය ආරම්භ විය. ඒ වන විට එම ප්‍රදේශයේ පිහිටි කුඩා බුත්ගමුව රජයේ පාසලේ විදුහල්පතිවරයා මෙම පාසලේ විදුහල්පති ලෙස පත්ව ආ අතර එම විදුහලේම ඉගෙනුම ලබමින් සිටි නාවලගේ බැනට් කුරේ ශිෂ්‍යයා මෙම විදුහලේ පළමු ශිෂ්‍යයා වශයෙන් ලියාපදිංචි විය. පසුකලක කොළොන්නාව මන්ත්‍රීවරයා වශයෙන්ද නියෝජ්‍ය අමාත්‍යවරයකු වශයෙන්ද සේවය කර වර්තමානයේ පලස්තීනයේ ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස සේවය කරන්නේ ඒ බැනට් කුරේය.


කරාතේ කණ්ඩායම

ශිෂ්‍ය ශිෂ්‍යාවන් එක්දහස් එකසිය අසූ පස් දෙනෙකු ඉගෙනුම ලබන අතර අධ්‍යයන මණ්ඩලය හැටතුන් දෙනෙකුගෙන්ද අනධ්‍යයන කාර්ය මණ්ඩලය දහසය දෙනෙකුගෙන්ද සමන්විත වේ. එමෙන්ම අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල සියයට අසූව දක්වා ඉහළ නංවා ගැනීමට සමත්ව ඇති අතර දහතුන් වසරක අඛණ්ඩ අධ්‍යාපන ඒකක වැඩ සටහනද ආරම්භ කොට ඇත.


නර්තන ඒකකය

අධ්‍යාපනයට මෙන්ම ක්‍රීඩා, කලා, නව නිපැයුම් අංශවලින්ද මෙහි සිසුන් ඉහළින්ම දස්කම් දක්වා ඇත. 2022 වර්ෂයේ පාසල් නාට්‍ය කණ්ඩායම බස්නාර පළාත් ප්‍රථම ස්ථානය හිමිකරගත් අතර සමස්ත ලංකා තරගයට සුදුසුකම් ලැබීය.

වේදිකාව, සිනමාව, රූපවාහිනිය තුළින් දක්ෂතාවන් දක්වන ප්‍රවීණ රංගන ශිල්පිනී රත්නා ලාලනී ජයකොඩි ගුරුතුමිය සිය ශිල්පීය ඥානය සිසුන්ට ලබා දෙන්නේ නාට්‍ය හා රංගකලා විෂයභාර ගුරුවරිය වශයෙනි.

ක්‍රීඩා අංශයෙන් දස්කම් දක්වන සිසුන් බොහොමයකි. වයස අවුරුදු 19න් පහළ ක්‍රිකට් කණ්ඩායම 2022 වර්ෂයේ බස්නාහිර පළාතේ ප්‍රථම ස්ථානයද සමස්ත ලංකා තරගාවලිය සඳහාද සුදුසුකම් ලබා ඇත. වයස අවුරුදු 15න් පහළ 17න් පහළ සහ 19න් පහළ ක්‍රිකට් කණ්ඩායම් තුනකි.

මේ මස 31 වැනි දින ඕවල් ක්‍රීඩාංගණයේදී බෝමිරිය මහා විද්‍යාලය සමග පැවැත්වෙන 'නිම්නයක සටන' අන්තර් පාසල් ක්‍රිකට් තරගය සඳහා පාසල් ක්‍රිකට් කණ්ඩායම මෙවර ප්‍රථම වතාවට සහභාගි වේ.


වෙස් නර්තන කණ්ඩායම


සංගීත කාමරය

''තමා තමාට පහනක් වන්න'' යන තේමා පාඨය පෙරදැරිව දැයට ආලෝකයක් එක් කරන මෙම පාසලෙන් රටට දැයට දයාද කළ උගතුන් බුද්ධිමතුන්, කලාකරුවන් දේශපාලනඥයන් රාශියකි. මේ දක්වා සිටි ගුරුවරුන්, විදුහල්පතිවරුන්, විදුහල වත්මන් තත්ත්වය කරා ගෙන ඒම සඳහා දූරදර්ශී නායකත්වය ලබා දෙමින් කටයුතු කළ අතර වර්තමානයේ එම නායකත්වයට උර දෙන්නේ එස්.එම්.ජී. ප්‍රියදර්ශනී විදුහල්පතිනියයි.

2026 වර්ෂය වනවිට කුඩා බුත්ගමුව ශ්‍රී රාජසිංහ ජාතික පාසල කොළොන්නාව කොට්ඨාසයේ විශිෂ්ටතම පාසල බවට පත් කිරීම එතුමියගේ අපේක්ෂාවයි.

▼ සිරිසේන ගමගේ - කොළොන්නාව


දහතුන් වසරක අඛණ්ඩ අධ්‍යාපන ඒකකය


ගීතා කාන්ති ජයකොඩි ගුරුතුමිය ඇතුළු නාට්‍ය කණ්ඩායම


නායකත්ව පුහුණු වැඩසටහන


ආචාර්ය මණ්ඩලය